## ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

# වාර්ෂික වාර්තාව 2018


# සිංහල

## දැක්ම

නිවැරදි හා සාධාරණ ජයග්‍රහණයක්
උදෙසා තහනම් ද්‍රව්‍ය වලින් තොර
ශ්‍රී ලාංකීය ක්‍රීඩා ජවයක්

## මෙහෙවර

ලෝක මත්ද්‍රව්‍ය නිවාරණ පනත සහ
එහි රෙගුලාසි වලට අනුකූල වන
ආකාරයට **2013** අංක **33** දරණ ක්‍රීඩා
වල යෙදීමේදීඋත්තේජක ද්‍රව්‍ය ගැනීමට
එරෙහි සම්මුති පනත ක්‍රියාත්මක කිරීම





## සභාපතිතුමාගේ පණිවුඩය

ක්‍රීඩාව වනාහි හුදෙක් විනෝදය පිණිස කරනු ලබන ක්‍රියාකාරකමක් නොව මානවයාගේ ශරීර සෞඛ්‍ය යහ පැවැත්මෙන් පවත්වාගෙන යෑම, යහපත් ගුණාංග හුරුපුරුදු සහ අත්දැකීම් ජීවිතයට එක්කර ගැනීම සහ විවිධ ජාතීන් සහ හා ආගමික වශයෙන් වෙන් වූ ජන කණ්ඩායම් අතර සහජීවනය ඇතිකිරීමෙහිලා ද දායක කරගත හැකි කදිම සංකල්පයකි. නමුත් වර්තමාන සමාජය, කාලය සමඟ ක්‍රමිකව විකාශනය වන විට ක්‍රීඩාව නැමති සංකල්පයද වාණිජකරණය වීමත් එය හුදෙක් ජයග්‍රහණය ලැබීම පිණිසත් ඉලක්ක කරගෙන සිදුවන බව ප්‍රකට තත්වයකි.

වර්තමානයේ විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ පරිපාලනය වන ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය බිහිවී දැනට වසර පහකි. මෙම පසුගිය වසර පහ මුළුල්ලේ ශ්‍රී ලාංකික ක්‍රීඩාවේ ජීව ගුණය වෙනුවෙන් සිදුකල මෙහෙය අනගිභවණීය වන අතර එමඟින් ලද පන්නරය ඉදිරි දශක ගණනාවකටම ධනාත්මක බලපෑමක් සිදු කරනු ඇත.

2018 වර්ෂය මුළුල්ලේ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සිය සුපුරුදු ශ්‍රිතික කාර්යයන් වන උත්තේජක පරීක්ෂණ සිදු කිරිම, දැනුවත් කිරීම් සිදු කිරීම සහ පර්යේෂණ සිදු කිරීම සාර්ථකව ක්‍රියාවට නැංවුණි. 2018 වසර තුළදී ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් තහනම් උත්තේජක පරීක්ෂණ 280 ක ප්‍රමාණයක් සිදුකරන ලදී. ඒ සඳහා ජාතික මට්ටම සහ ජාත්‍යන්තර තරඟ බිම වෙත පිවිසෙන ශ්‍රී ලාංකීය ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඉලක්ක කොට අහඹු ලෙස මුත්‍රා රුධිර සාම්පල ලබාගෙන සිදු කරන ලදී. වසර පුරාම දිවයිනේ විවිධ කොටස් ආවරණය වන පරිදි ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණු කරුවන්, පාසල් ළමුන් මෙන්ම ඔවුන්ගේ දෙමාපියන් සහ ක්‍රීඩාව සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන බහුතරයක් වූ පිරිසගේ දැනුවත් භාවය වැඩි කිරිම පිණිස වැඩමුළු, සම්මන්ත්‍රණ පැවැත්වීමටද කටයුතු යෙදිණි.

ආසියානු සහ ශාන්තිකර කලාපීය රටවල් ගණනාවක සහභාගිත්වයෙන් සෑම වසරක් පසාම පැවැත්වෙන “Asia Oceania Region Intergovernmental Ministerial Meeting on Anti – Doping in Sports” 15 වන සමුළුව 2018 වර්ෂයේ මෙරටදී පැවැත්වීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සත්කාරකත්වය ලබා දෙන ලදී. එය කොළඹ කිංග්ස්බරි හෝටලයේදී 2018.06.18 සහ 19 යන දෙදින තුළ රටවල් 27 ක රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් සාර්ථකව පැවැත්වීමට කටයුතු යෙදුණි. එය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ කැපීපෙනෙන සංදිස්ථානයක් සනිටුහන් කිරීමක් විය.ඉන් පසු 2018.06.20 සහ 21 යන දෙදින දකුණු ආසියානු කලාපීය තහනම් උත්තේජක සංවිධානයේ (South Asian Regional Anti - Doping Organization) 2018 වර්ෂය සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම කොළඹ කිංග්ස්බරි හෝටලයේදී සාර්ථකව පැවැත්වීමට ද කටයුතු යෙදිණි. ඒ සඳහා සාමාජිකත්වය දරණ කලාපීය රටවල් 5ක නියෝජිතයන් සහභාගි විය.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතන ගොඩනැගිලි පරිශ්‍රයේ ඉදිකිරීම් 2018 වසර පුරාම නිමවෙමින් පැවති අතර එය 2019 වසර මුලදී ඉහළ රාජ්‍ය ත්‍රාන්ත්‍රික ප්‍රභුවරුන්ගේ මුලිකත්වයෙන් විවෘත කිරීමට කටයුතු යොදා තිබේ. ඒ සමඟ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ පර්යේෂණ ඒකකය ඉදි කිරීමට කටයුතු සිදු කරමින් පවතින අතර එය 2019 වසර තුළදී නිම කර රටෙහි අනාගතයට

දායක කරවීම අපගේ බලාපොරොත්තුවයි. මෙම භෞතික හා මානව සම්පත් ලැබීම් තුළ ආයතනයේ ඉදිරි කර්තව්‍යයන් පෙරට වඩා සාර්ථකව කිරීමට හැකිවනවා පමණක් නොව වඩා කාර්යක්ෂම හා සඵලදායි ගමනක් තුළින් අව්‍යාජ ක්‍රීඩාවක් ප්‍රවර්ධනය කිරීමට හැකිවන බව පවසනුයේ මහත් වූ අභිමානයෙනි.

2018 වසරේදී අප විසින් රුධිර සාම්පල ලබාගැනීම මඟින් තහනම් උත්තේජක පරීක්ෂණ සිදුකිරීමේ කටයුතු ආරම්භ කල අතර 2019 වසර පුරාම එය ප්‍රවර්ධනය කිරීමට අප බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නව ගොඩනැගිලි පරිශ්‍රය ඉදිවීමත්, පර්යේෂණ ඒකකය බිහිවීමත් යන කාරණා හේතු කොට ගෙන මේ දක්වා සිදුකර ඇති සේවය වඩාත් තීව්‍රව ඉදිරිකාලයේදී සිදුකිරීමට හැකි වන අතර, තව දුරටත් නව තාක්ෂණය හා නවීන ක්‍රමවේදයන්ගේ වෙනස්වීම් ආයතනයේ ක්‍රියාකාරිත්වයට එක් කොට යවත්කාලීන කර ගැනීම මඟින් වඩා හොඳ ප්‍රශස්ථ සේවයක් ශ්‍රී ලංකාවේ අව්‍යාජ ක්‍රීඩාවේ උන්නතියට සිදුකිරීම පිණිස හැකියාව ලැබේවායි සුභාශිංෂණය කරමි.

**මහාචාර්ය අර්ජුන ද සිල්වා**
**සභාපති**



## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජයායතනය බිහිවී මේ වන විට වසර පහක් ගතවී තිබේ. 2013 වසර අගභාගයේ සිට මේ දක්වා ගතවු කාලපරාසය තුළ අප ආයතනය විසින් ශ්‍රී ලංකාවේ අව්‍යාජ ක්‍රීඩාවට කළ මෙහෙය සුවිශාලය. ක්‍රීඩාවේදී තහනම් ද්‍රව්‍ය සහ ක්‍රම පිටුදැකීම වෙනුවෙන් තහනම් උත්තේජක පරීක්ෂණ හා දැනුවත් කිරීම්, පසුගිය කාල පරිච්ඡේදයේ සාර්ථකව ක්‍රියාවට නැංවූ අතර, මෑතක් වන තුරු මූත්‍රා සාම්පල පමණක් භාවිත කර සිදු කල තහනම් උත්තේජක පරීක්ෂණයන්ට අමතරව 2018 වසරේ සිට රුධිර සාම්පල යොදා පරීක්ෂණ සිදුකිරීම ආරම්භ කරන ලදී. එය 2018 වසර තුළදී අප සිදු කල කාර්යයන් අතරින් සුවිශේෂ සංධිස්ථානයකි.

2018 වසර ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායයතනයට සුවිශේෂ කඩයිම් වසරක් විය. මන්ද “15th Asia Oceania Region Intergovernmental Ministerial Meeting on Anti – Doping in Sports” සමුළුව 2018 සඳහා සත්කාරකත්වය ලබාදීමටත් එම සමුළුව අතරතුරදී ඔස්ට්‍රේලියානු උත්තේජක මර්දන අධිකාරිය සමඟ දැනුම සහ මානව සම්පත් සංවර්ධනය සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමටද අපට හැකිවිය.

එමඟින් 2018 වසර නිමවීමට මත්තෙන් වටිනා දැනුම හා තාක්ෂණික ඥානය හුවමාරු කර ගැනීමට අවස්ථාවක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත ලැබීම ශ්‍රී ලාංකික ක්‍රීඩා ක්ෂේත්‍රය ලද සුවිශාල කඩයිමක් බව පවසනුයේ මහත්වූ අභිමානයෙනි.

ගතවු වසර පහක කාලය තුළ ලබාගත් ජයග්‍රහණයන් හේතුකොට ගෙන ඇතිවු පන්නරයෙන් ඉදිරි අනාගතය සඳහා දැවැන්ත අඩිතාලමක් අප හට ගොඩනගා ගැනීමට සැලසුම් කර තිබේ.

අප ආයතනයේ නීතිය හා බලාත්මක කිරීම් අංශය බලගැන්වීම තුළින් ශ්‍රී ලංකාවට විවිධ මාර්ග ඔස්සේ පැමිණෙන ආහාර අතිරේක, ඖෂධ නියාමනය කර ප්‍රමිතිගත කිරීම අපගේ ප්‍රධාන ඉලක්කයකි. මේ සඳහා සම්බන්ධවන අනෙකුත් නියාමන ආයතන වන ශ්‍රී ලංකා රේගුව, ඖෂධ නියාමන අධිකාරිය වැනි ආයතන සමඟ එක්ව මෙරටට ගෙන එන මෙම

නිතිවිරෝධී ඖෂධ හා ආහාර අතිරේක පාලනය කිරීමටත් ඒ සඳහා සුදුසු ප්‍රමිතිකරණයකට ලක්කිරීමක් කර මනා යාන්ත්‍රණයක් ඇති කිරීමට ද බලාපොරොත්තුවේ. මන්ද එසේ නොකළහොත් ශ්‍රී ලාංකික ක්‍රීඩා ක්ෂේත්‍රයටත් අනාගත පරපුරෙහි සෞඛ්‍ය සහ පෝෂණයටත් සිදුවන හානිය සුළු පටු නොවන බැවිනි.

2018 වසරේදී අප ආයතනය විසින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කරුවන්, වෛද්‍ය වෘත්තිකයින් සඳහා භාවිතයට ගත හැකි Doctor App නමින් ඩිජිටල් ඇන්ඩ්‍රොයිඩ් යෙදුමක් සකස්කිරීමට අප කටයුතු කරන ලදී. ඒ තුළින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ලබාගන්නා ඖෂධ හා පෝෂණ අතිරේකයන්හි තහනම් ද්‍රව්‍ය සංඝටක අන්තර්ගතවේද යන වග පරිශීලනය කිරීමට හැකියාව ලැබෙනු ඇත.

2018 වසර තුළදී අප ආයතනය විසින් ජපාන උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (JADA) වෙතින් තාක්ෂණික දැනුම හුවමාරු කොට Real Champion නමින් සුවිශේෂ වැඩසටහනක් සකස් කර ඉදිරිපත් කරන ලදී. එමඟින් ආකර්ශනීය ස්වභාවයෙන් යුක්තව දැනුවත් කිරිමේ වැඩසටහන් හා තහනම් ද්‍රව්‍ය පිටුදැකීම

පිළිබඳ දැනුම වැඩිකර ගැනීමට ක්‍රීඩාව කෙරෙහි උනන්දුවක් දක්වන ශ්‍රී ලාංකිකයන්ට අවකාශ හිමි වන අතර , මෙහි සංකල්ප හා දැනුම (Module) ජපන් උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ දායකත්වය මඟින් ලබාදීමට එකඟ වීම අපගේ රට ලැබූ භාග්‍යයක් ලෙස ගෙන හැර දැක්විය හැක.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සඳහා සුගතදාස ක්‍රීඩාංගණ පරිශ්‍රයෙන් ලද ඉඩමෙහි ඉදිවන ගොඩනැගිලි පරිශ්‍රය 2019 වසර මුල දී උත්කර්ෂවත් අන්දමින් විවෘත කිරීමට යොදාගෙන තිබෙන අතර, එහි පර්යේෂණ ඒකකයේද සියලු ඉදිකිරීම් 2019 වසර තුළදී නිම කිරීමට බලාපොරොත්තු වේ. මෙවැනි භෞතික සම්පත් ලැබීම තුල ශ්‍රී ලාංකීය ක්‍රීඩාවේ උන්නතියට සිදුවන මෙහෙය පැසසිය යුතු අතර වර්තමානයේ මෙන්ම අනාගතයේදී ද ශ්‍රී ලංකාවේ අව්‍යාජ ක්‍රීඩාවට මහත්වූ සේවයක් සිදුකිරීමට හැකිවේවා යැයි සුභාශිංශණය කරමි.

**වෛද්‍ය සීවලී ජයවික්‍රම,**

**අධ්‍යක්ෂ ජනරාල්**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අරමුණු

පනතේ 11 වැනි වගන්තිය ප්‍රකාරව:-

නියෝජ්‍යායතනයේ පරමාර්ථ විය යුත්තේ :-

(අ) ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීම පිටුදැකීම සඳහා අවශ්‍ය වන යම් පියවර ගැනීම.

(ආ) ක්‍රීඩාවලට සම්බන්ධ උත්තේජක ගැනීම පිළිබඳ ක්ෂේත්‍ර හා අදාල පර්යේෂණ සහ නියෝජ්‍යායතනය හා සමාන කර්තව්‍ය ඉටුකරනු ලබන වෙනත් අන්තර්ජාතික සංවිධාන අතර අන්‍යොන්‍ය පරීක්ෂණ ප්‍රවර්ධනය කිරීම.

## සේවා

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සිය අරමුණු ඉටුකර ගැනීම සඳහා පහත සඳහන් සේවාවන් සැපයීම සිදුකරනු ලබයි.

01. ජාතික, අන්තර්ජාතික හා පාසල් මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ උත්තේජක පරීක්ෂණ සිදුකිරීම.

02. තහනම් ද්‍රව්‍ය හා තහනම් ක්‍රම භාවිතා කර ඇති බවට සනාථ වූ ක්‍රීඩකයින් සම්බන්ධයෙන් විනය ක්‍රියා මාර්ග ගැනීම.

03. තහනම් ද්‍රව්‍ය භාවිතය හා එහි අනිටු විපාක පිළිබඳ ක්‍රීඩකයින්, පුහුණුකරුවන්, පාසල් සිසුන්, දෙමාපියන් හා අනෙකුත් ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියැලෙන්නන් දැනුවත් කිරීම.

04. යුනෙස්කෝ ආයතනයේ අරමුදල් සහිතව ක්‍රීඩාවේදී භාවිතාවන තහනම් ද්‍රව්‍ය හා තහනම් ක්‍රම, එහි අනිටු විපාක හා තහනම් ද්‍රව්‍ය පරීක්ෂණ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් දිවයින පුරා දිස්ත්‍රික්ක මට්ටමින් සිදු කිරීම.

05. ක්‍රීඩාවේ යෙදීමේදී තහනම් ද්‍රව්‍ය භාවිතය පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා පාසල් විෂය මාලාවට මෙම අංගය එක්කිරීමට කටයුතු සම්පාදනය කිරීම

## අධ්‍යක්ෂ මණ්ඩලය



මහාචාර්ය අර්ජුන ද සිල්වා
සභාපති



මහාචාර්ය ලාල් ජයකොඩි



මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු



සජිත් ජයලාල් මහතා



ඩි.මුතුගල මහතා



වෛද්‍ය අන්වර් හම්දනී



එස්.අයි.එම්.රෝසා මහතා



චාමර හේරත් මහතා



**වෛද්‍ය ඊ. ඒ. එල්. සී. කේ. එදිරිසිංහ මහතා**



කේ.පී.සිරිබද්දන මහතා

# වත්මන් විධායක කාර්යය මණ්ඩලය



**වම් පස සිට**

1. කේ.ආර්.කණගසභාපති -භාෂා පරිවර්තක

2. එස්.ඒ.එන්.රෂානි - පර්යේෂණ නිලධාරී

3. ආර්.එම්.ආර්.ගුණවර්ධන - නීති නිලධාරි / මාණ්ඩලික ලේකම්

4. ජී. නිශාන් ප්‍රනාන්දු මහතා - පරිපාලන නිලධාරි

5. එච්. එම්. සී. ජී. දයාරත්න මහතා - ගණකාධිකාරී

6. වෛද්‍ය සීවලි ජයවික්‍රම මහතා - අධ්‍යක්ෂ ජනරාල්

7. වෛද්‍ය එස්. පී. පී. ද අල්විස් මිය - අධ්‍යක්ෂ

8. ඒ.එස්.ඒ.ඕ.පීරේරා - පර්යේෂණ නිලධාරී

9. වයි.ඒ.යූ.මේධාවි - තොරතුරු තාක්ෂණ නිලධාරී

10. පී.එන්.ජේ.ප්‍රනාන්දු - පර්යේෂණ නිලධාරී

## කාර්යය මණ්ඩලය - 2017

අපගේ වර්තමාන කාර්ය මණ්ඩලය



වෛද්‍ය සීවලි ජයවික්‍රම
අධ්‍යක්ෂ ජනරාල්



වෛද්‍ය එස්.පී.පී. ද අල්විස් අධ්‍යක්ෂ
(අධ්‍යාපන හා පරීක්ෂණ)



ආර්.එම්.ආර්.ගුණවර්ධන
නීති නිලධාරි / මාණ්ඩලික ලේකම්



එච්.එම්.සී.පී. දයාරත්න මහතා
ගණකාධිකාරී



ඒ.එස්.ඒ.ඩී.පිගේරා
පර්යේෂණ නිලධාරී



එස්.ඒ.එන්.රෂානි
පර්යේෂණ නිලධාරී



පී.නිලු ප්‍රනාන්දු
පර්යේෂණ නිලධාරී



පී. නිශාන් ප්‍රනාන්දු මහතා
පරිපාලන නිලධාරි



වයි.ඒ.යූ.මේධාවි
තොරතුරු තාක්ෂණ නිලධාරී



කේ.ආර්.කණගසභාපති
භාෂා පරිවර්තක



එස්.එස්.කේ.තෝමස්
සංවර්ධන නිළධාරි



පී.පී.එම්.අයි.අරුණ කුමාර
සංවර්ධන නිළධාරි



එස්.සූරියරාණි
සංවර්ධන නිළධාරි



එන්.පී.එස්.එච්.විජේරත්න
කළමනාකරණ සහකාර



එම්.පී.ටී.ඩී.සේනාරත්න
කළමනාකරණ සහකාර



ඩබ්.එම්.එස්.කේ.වික්‍රමසිංහ
කළමනාකරණ සහකාර



එම්.පී.එස්.අයි.කරුණාතිලක
කළමනාකරණ සහකාර



ඒ.පී.එල්.කේ.එස්.ගුණවර්ධන
කාර්යාල කාර්ය සහයක



ඒ.පී.පී.ඩී.තිලකරත්න
කාර්යාල කාර්ය සහයක



එම්.ඩී.ආර්.ඩී.ජයවීර
කාර්යාල කාර්ය සහායක



කේ.පී.සී.ප්‍රේමරත්න
රියදුරු



කේ.එම්.එල්.වැවේතැන්න
රියදුරු



කේ.ඒ.අයි.ආර්.සේනාරත්න
රියදුරු



ඩබ්ලිව්.ටී.චතුර්යා ලහිරුනි
අභ්‍යාසලාභිනි

# ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි ජාත්‍යන්තර සම්මුතිය බලාත්මක කිරීම පිණිසද, උත්තේජක ද්‍රව්‍ය මර්දන නියෝජ්‍යායතනයක් ශ්‍රී ලංකාව තුළ පිහිටුවීම මගින් එකී සම්මුතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සැලැස්වීම පිණිසද, ඉහත කී සම්මුති රාමුව තුළ ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහිවීම සඳහා අදාල දේශීය නෛතික යාන්ත්‍රණයක් නිශ්චිතවම සඳහන් කිරීම සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිසද 2013 අංක 33 දරණ ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත 2013 සැප්තැම්බර් 09 වැනි දින කෙටුම්පත් කරන ලදී.

2013 අංක 33 දරණ ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ තුන්වැනි කොටස මගින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායාතනය පිහිටුවීම පිළිබඳ විධිවිධාන සලස්වා ඇත.

මෙම ආයතනයේ මූලික අරමුණු අතර පර්යේෂණ අංශය ප්‍රමුඛ ස්ථානයක් හිමිකර ගනී. එහිදී බලාපොරොත්තු වන්නේ උත්තේජක භාවිතයේ හා උත්තේජක පරීක්ෂණවල නව ප්‍රවණතා හඳුනා ගැනීම, ශ්‍රී ලංකාවේ සිදුකරන උත්තේජක පරීක්ෂාවන් ජාත්‍යන්තර ප්‍රමිතිවල මට්ටමින් පවත්වා ගැනීම ආදිය වේ. එමෙන්ම, දේශීය වෛද්‍ය ක්‍රමද ප්‍රමුඛ ස්ථානයක් ගන්නා ශ්‍රී ලංකාව වැනි පෙරදිග රටක එම ඖෂධවල අන්තර්ගතය හා ඒවායේ තහනම් ද්‍රව්‍ය අඩංගු විය හැකිද යන්න පිළිබඳව සොයා බැලීම සඳහා පර්යේෂණ වල නියැලීමද මෙහි මූලික පරමාර්ථ අතර වේ.

තහනම් ද්‍රව්‍ය භාවිතාව හා එහි අතුරු විපාක ශ්‍රී ලංකාවට තවමත් නව මාතෘකාවකි. එම නිසා මහජනතාව හා ක්‍රීඩාවේ යෙදී සිටින පුද්ගලයින් අතර පවා උත්තේජක භාවිතය පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැත. එසේ හෙයින් මේ සම්බන්ධයෙන් මහජන දැනුවත්භාවය ඇති කිරීමේ වගකීමක්ද මෙම ආයතනය සතුවේ. එම නිසා යුනෙස්කෝ ආයතනයේ මූලයාධාර සහිතව දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන අතර මීට අමතරව එක් එක් ක්‍රීඩාවල යෙදෙන්නන් වෙනුවෙන්ද අවශ්‍ය අවස්ථාවලදී දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහන් පවත්වනු ලබයි. පාසල් මට්ටමින්ද වැඩසටහන් පැවැත්වීමට සැලසුම් සකස් කෙරෙමින් පවතී.

තහනම් ද්‍රව්‍ය භාවිතා කිරීම කෙටිකාලීනව ජයග්‍රහණ ලබා ගැනීමට පහසු මගක් වුවත්, ඉන් දීර්ඝ කාලීනව මිනිස් ශරීරයට ඇති විය හැකි බලපෑම සහ එහි අතුරු විපාක සුළුපටු නොවේ. දීර්ඝ කාලීන උත්තේජක භාවිතාව තුළින් ක්‍රීඩකයින්ගේ මරණය පවා සිදුවිය හැකිය. එම නිසා මෙම උවදුරින් ක්‍රීඩාව හා ක්‍රීඩකයින් මුදවා ගැනීම සඳහා අමිල මෙහෙවරක් මෙම ආයතනය මගින් සිදුකරනු ලැබේ. මෙය සමාජ උවදුරක් වීමට ප්‍රථමයෙන් තහනම් ද්‍රව්‍ය භාවිතය යන්න ක්‍රීඩාවෙන් මුලිනුපුටා දැමීම මෙම ආයතනයේ මූලික අරමුණයි.


රට නියෝජනය කරන යම්කිසි ක්‍රීඩකයෙක් තහනම් ද්‍රව්‍ය භාවිතා කර ඇති බව සනාථ වුව හොත් ඉන් රටේ ගෞරවයට වන හානිය අතිමහත්ය. එම නිසා මෙම වැරදි භාවිතාව මෙරටින් තුරන්කර ශ්‍රී ලාංකීය අභිමානය ජාත්‍යන්තර ක්‍රීඩා තලය ඉදිරියේ ඉහළින්ම රැකගැනීම අප ආයතනයේ මූලික අරමුණකි.

# කාර්යය මණ්ඩල තොරතුරු

කළමණාකරණ සේවා දෙපාර්තුමේන්තුව විසින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත 27 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් අනුමත කර ඇත.

| | තනතුරු නාමය | වැටුප් තලය | තනතුරු සංඛ්‍යාව | වර්තමාන සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01. | අධ්‍යක්ෂ ජනරාල් | HM 2-1 | 01 | 01 | - |
| 02. | අධ්‍යක්ෂ | HM 1-1 | 02 | 01 | 01 |
| 03. | සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ | MM 1-1 | 02 | - | 02 |
| 04. | ගණකාධිකාරී | MM 1-1 | 01 | 01 | - |
| 05. | නීති නිලධාරී /අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | MM 1-1 | 01 | 01 | - |
| 06. | පරිපාලන නිලධාරී | JM 1-1 | 01 | 01 | - |
| 07. | පර්යේෂණ නිලධාරී | AR 1 | 03 | 03 | - |
| 08. | භාෂා පරිවර්තක | MA-4 | 01 | 01 | - |
| 09. | තොරතුරු තාක්ෂණ නිලධාරී | JM 1-1 | 01 | 01 | - |
| 10. | සංවර්ධන නිලධාරී | MA 3 | 03 | 03 | - |
| 11. | කළමනාකාරණ සහකාර | MA 1-1 | 04 | 04 | - |
| 12,. | රියදුරු | PL 3 | 04 | 03 | 01 |
| 13. | කාර්යාල සහයක | PL 1 | 03 | 03 | - |
| | එකතුව | | 27 | 23 | 04 |


# සංවිධාන ව්‍යුහය


සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පරීක්ෂණ)
අධ්‍යක්ෂ (ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීම)
සහකාර අධ්‍යක්ෂ
ගණකාධිකාරී
නීති නිලධාරී / මාණ්ඩලික ලේකම්
සහකාර අධ්‍යක්ෂ
පර්යේෂණ නිළධාරී (03)
තොරතුරු තාක්ෂණ නිළධාරී
පරිපාලන නිළධාරී
භාෂා පරිවර්තක
සංවර්ධන නිළධාරී
සංවර්ධන නිළධාරී
සංවර්ධන නිළධාරී (02)
කළමණාකරණ සහකාර
කළමණාකරණ සහකාර
කළමණාකරණ සහකාර (02)
රියදුරු (04)
කාර්යාල සහයක (03)
HM
MM 1.1
AR-1
JM
MA-4
MA-3
MA 1-1
PL-3
PL-1

## <u>තහනම් උත්තේජක පරීක්ෂණ-2018</u>

2018 වර්ෂය ආරම්භයේ සිට දෙසැම්බර් මස 31 වන දින දක්වා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සිදුකළ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ තහනම් උත්තේජක පරීක්ෂණ පහත පරිදි වේ.

| අංකය | ක්‍රීඩාව | පරීක්ෂණ ගණන | | තහනම් උත්තේජක ගැනීම් සනාථ වූ අවස්ථා | |
|---|---|---|---|---|---|
| | | **2017** | **2018** | **2017** | **2018** |
| 1. | රග්බි | 38 | 47 | - | 02 |
| 2. | මලල ක්‍රීඩා | 63 | 125 | 01 | 01 |
| 3. | පාපැදි | 2 | 13 | - | 01 |
| 4. | බර එසවීම | 15 | 17 | - | - |
| 5. | බොක්සිං | 04 | 10 | - | - |
| 6. | ක්‍රිකට් | - | 12 | - | - |
| 7. | පිහිනීම | 02 | 5 | - | - |
| 8. | කායවර්ධන | 03 | 3 | 02 | - |
| 9. | බැඩ්මින්ටන් | - | 2 | - | - |
| 10. | සවි එසවීම | 04 | 12 | 02 | 02 |
| 11. | ජූඩෝ | - | 1 | - | - |
| 12. | වෙඩි තැබීම | - | 2 | - | - |
| 13. | ඵුට්බෝල් | - | 6 | - | - |
| 14. | කබඩි | - | 14 | - | - |
| 15. | පැරා | - | 3 | - | - |
| 16. | ටෙනිස් | - | 3 | - | - |
| 17. | මල්ලවපොර | | 1 | | |
| | **එකතුව** | **134** | **276** | **05** | **06** |




- රුධිර සාම්පල පරීක්ෂණ 04 ක් ද සිදුකරන ලදි.
- SARADO සඳහා තහනම් උත්තේජක පරීක්ෂණ 10 ක් 2018 වර්ෂයේ දී සිදු කරන ලදි.

එමෙන්ම තුරඟ තහනම් උත්තේජක පරීක්ෂණ ද සිදුකළ අතර ඒවා පහත පරිදි වේ.

| අංකය | ක්‍රීඩාව | පරීක්ෂණ ගණන | තහනම් උත්තේජක ගැනීම් සනාථ වූ අවස්ථා |
|---|---|---|---|
| 01 | තුරඟ තරඟ | 09 | - |
| | **එකතුව** | 09 | - |

## දැනුවත් කිරීමේ වැඩසටහන්

2018 ජනවාරි මස  සිට දෙසැම්බර් මස දක්වා පහත සඳහන් පරිදි දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්විය. මෙම වැඩමුළු ක්‍රීඩක ක්‍රීඩිකාවන්, ක්‍රීඩා පුහුණුකරුවන්, ක්‍රීඩා පරිපාලකයින්, පාසල් ළමුන්, ගුරුවරුන්, ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දෙමව්පියන් හා ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියැලෙන්නන් අරමුණු කරගෙන සිදු කරන ලදී. එහිදී පහත සඳහන් කරුණු අවධාරණය කරන ලදී.

2018 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා කාලය තුළ ශ්‍රී ලංකා උත්තේජන මර්දන නියෝජ්‍යායතනයේ මෙහෙයවීමෙන් පැවති සම්මන්ත්‍රණ සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ සාරාංශය පහත පරිදි වේ.

| දිනය | ස්ථානය | ඉලක්කගත කණ්ඩායම | සහභාගීත්වය |
|---|---|---|---|
| 2018.01.10 | බොරැල්ල රෝයල් ගොල්ෆ් ක්ලබ් | බොරැල්ල ගොල්ෆ් ක්ලබ් | 27 |
| 2018.01.11 | ශ්‍රී ලංකා පදනම | ක්‍රීඩා සම්බාහකයින් හා භෞත චිකිත්සක පුහුණුකරුවන් | 70 |
| 2018.01.18 | ශ්‍රී ලංකා පදනම | භෞත චිකිත්සක පුහුණුකරුවන් | 82 |
| 2018.01.18 | ශ්‍රී ලංකා පදනම | ක්‍රීඩා සම්බාහකයින් හා භෞත චිකිත්සක පුහුණුකරුවන් | 70 |
| 2018.01.23 | මළල ක්‍රීඩා සංගමය | පුහුණුකරුවන් හා කනිෂ්ඨ මළල ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 6 |
| 2018.01.24 | ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමය | පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා සඳහා සුදුසුකම් ලැබූ බැඩ්මින්ටන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 5 |
| 2018.01.24 | ක්‍රීඩා අමාත්‍යාංශ ශ්‍රවණාගාරය | ක්‍රීඩා පෝෂණ පිළිබඳ කමිටුව, පාසල් ක්‍රීඩකයින්, දෙමව්පියන්, පුහුණුකරුවන් පුහුණුකරන්නන් | 45 |
| 2018.01.26 | ටොරින්ටන් | දකුණු ආසියානු ක්‍රීඩා හා ආසියානු ශූරතාවලිය සඳහා සහභාගී වන කරාටේ ක්‍රීඩකයින් | 10 |
| 2018.02.08 | නේවාසිකාගාර ආපනශාලාව | ජාතික දැල්පන්දු ක්‍රීඩිකාවන් | 28 |
| 2018.02.20 | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | කනිෂ්ඨ මළල ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 22 |
| 2018.02.22 | ජාතික වෙඩි තැබීමේ සංගමය | පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා සඳහා සහභාගීවන වෙඩි තැබීමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 03 |
| 2018.02.23 | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | පාසල් රගර් පුහුණුකරුවන් හා පුහුණුකරන්නන් | 43 |
| 2018.02.24 | සීනිගම, හික්කඩුව | Foundation of Goodness | 115 |
| 2018.02.26 | රාජකීය විද්‍යාලීය ක්‍රීඩාංගනය | කොළඹ රාජකීය විද්‍යාලයේ රගර් ක්‍රීඩකයින් | 33 |
| 2018.03.09 | ටොරින්ටන් | පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා සඳහා සහභාගි වන මළල ක්‍රීඩකයින්ගේ කණ්ඩායම | 04 |
| 2018.03.13 | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | BORNEO 7's සඳහා සහභාගී වන පිරිමි රගර් කණ්ඩායම | 12 |

| | | | |
|---|---|---|---|
| 2018.03.13 | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | BORNEO 7's සඳහා සහභාගී වන කාන්තා රගර් කණ්ඩායම සඳහා | 10 |
| 2018.03.29 | නේවාසිකාගාර ආපනශාලාව | පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා සඳහා සහභාගී වන මල්ලව පොර කණ්ඩායම | 03 |
| 2018.04.02 | බොරැල්ල ගොල්ෆ් ක්ලබ් | ගොල්ෆ් ජාතික සංචිතයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 20 |
| 2018.04.04 | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | ජාතික කබඩි සංචිතයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 23 |
| 2018.05.03 | ශ්‍රී ලංකා පාපන්දු පුහුණු මධ්‍යස්ථානය | ශ්‍රී ලංකා පාපන්දු ක්‍රීඩකයින් | 40 |
| 2018.05.16 | ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමය | බැඩ්මින්ටන් ජාතික සංචිතයෙහි ක්‍රිඩක ක්‍රීඩිකාවන් | 6 |
| 2018.05.17 | ශ්‍රී ලංකා දුණු විදීමේ සංගමය | 2018 ආසියානු ක්‍රීඩා සඳහා සහභාගී වන දුණු විදීමේ ජාතික සංචිතයෙහි ක්‍රිඩක ක්‍රීඩිකාවන් | 14 |
| 2018.05.31 | නේවාසිකාගාර ආපනශාලාව | කනිෂ්ඨ මළල ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 7 |
| 2018.06.03 | ඖෂධ පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය | Sports & Exercise Medicine පිළිබඳ ඩිප්ලෝමාව හදාරන වෛද්‍යවරුන් | 14 |
| 2018.06.25 | ගැටඹේ ක්‍රීඩාංගනය | Elite Summer Swimming Camp with Liam Tancock මඟින් සංවිධානය කරන ලද Tracy from Ceylon Tours | 21 |
| 2018.07.05 | හොකී ක්‍රීඩාංගනය ටොරින්ටන් | 2018 ආසියානු ක්‍රීඩා සඳහා සහභාගී වන හොකී ක්‍රීඩකයින් | 24 |
| 2018.07.06 | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | 2018 ආසියානු ක්‍රීඩා සඳහා සහභාගී වන කබඩි පිරිමි ක්‍රීඩකයින් | 15 |
| 2018.07.06 | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | Sports Injury Management පාඨමාලාව සඳහා සහභාගී වූවන් | 25 |
| 2018.07.09 | ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමය | ආසියානු කනිෂ්ඨ ශූරතාවලිය සඳහා සහභාගී වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 10 |
| 2018.07.12 | මහනුවර ට්‍රිනිටි විද්‍යාලය | පාසල් ක්‍රීඩකයින් සහ පුහුණුකරුවන් | 55 |
| 2018.07.15 | ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය | 19 න් පහළ Squad Meeting | 31 |
| 2018.07.24 | ශ්‍රී ලංකා මළල ක්‍රීඩා සංගමය | මළල ක්‍රීඩා පුහුණුකරුවන් සහ ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 17 |
| 2018.07.25 | යුධ හමුදා කඳවුර පනාගොඩ | පනාගොඩ ක්‍රීඩා සංවර්ධන ගම්මානයේ ක්‍රීඩා සම්බාහකයින් | 60 |
| 2018.07.30 | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | 2018 ආසියානු ක්‍රීඩා සඳහා සහභාගී වන බොක්සිං ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 6 |
| 2018.07.31 | රග්බි යූනියන් | රගර් 20 න් පහල ජාතික සංචිතයෙහි ක්‍රීඩකයින් | 19 |
| 2018.07.31 | මාතර දිස්ත්‍රික් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | මාතර දිස්ත්‍රික් මළල ක්‍රීඩා සංගමය මෙහෙයවූ ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව සහ තහනම් උත්තේජක භාවිතය හා මර්දනය පිළිබඳ සම්මන්ත්‍රණය සඳහා සහභාගී වූ පුහුණුකරුවන් ගුරුවරුන් හා ක්‍රීඩා නිලධාරින් | 185 |
| 2018.08.05 | ජාතික ඔලිම්පික් කමිටුව | ජාතික ඔලිම්පික් කමිටුව මඟින් පැවැත්වූ පළමු වන ක්‍රීඩා පරිපාලන පාඨමාලාව සඳහා සහභාගිවූවන් | 43 |
| 2018.08.07 | කැළණිය විශ්ව විද්‍යාලයීය | 2018 ආසියානු ක්‍රීඩා සඳහා සහභාගී වන | 7 |

| | | | |
|---|---|---|---|
| | ශරීරික සුවතා මධ්‍යස්ථානය | ටයිකොන්ඩෝ ක්‍රීඩක ක්‍රීඩිකාවන් | |
| 2018.08.08 | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | 2018 ආසියානු ක්‍රීඩා සඳහා සහභාගී වන බේස්බෝල්,ඔරු පැදීමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 24 |
| 2018.08.10 | ටෙනිස් සංගමය | 2018 ආසියානු ක්‍රීඩා සඳහා සහභාගී වන ටෙනිස් ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 6 |
| 2018.08.13 | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | 2018 ආසියානු ක්‍රීඩා සඳහා සහභාගී වන ඔරු පැදීමේ, ජල ක්‍රීඩා සහ ආබාධිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 29 |
| 2018.08.14 | රග්බි යූනියන් | 2018 ආසියානු ක්‍රීඩා සඳහා සහභාගී වන රගර් ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 10 |
| 2018.08.16 | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | 2018 ආසියානු ක්‍රීඩා සඳහා සහභාගී වන බාස්කට් බෝල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 08 |
| 2018.08.17 | ශ්‍රී ලංකා පදනම | ශරීර සුවතා උපදේශකයින් | 82 |
| 2018.08.20 | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | 2018 ආසියානු ක්‍රීඩා සඳහා සහභාගී වන කරාටේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 5 |
| 2018.08.21 | හිල්ටන් හෝටලය | ක්‍රිකට් ක්‍රීඩකයින්, පුහුණුකරුවන් හා සහයක පාර්ශවයන් සඳහා | 71 |
| 2018.08.29 | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ ක්‍රීඩා ඩිප්ලෝමාව හදාරන ශිෂ්‍යයින් | 56 |
| 2018.08.30 | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ ක්‍රීඩා ඩිප්ලෝමාව හදාරන ශිෂ්‍යයින් | 52 |
| 2018.08.30 | සෙන් පීටර් විද්‍යාලය | පාසල් ශිෂ්‍යයින් | 38 |
| 2018.09.10 | රගර් යූනියන් | ජාතික කාන්තා රගර් සංචිතයේ ක්‍රීඩිකාවන් | 15 |
| 2018.09.19 | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | යොවුන් ඔලිම්පික් ක්‍රීඩා සඳහා සහභාගී වන බාස්කට්බෝල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 08 |
| 2018.09.25 | ශ්‍රී ලංකා මළල ක්‍රීඩා සංචිතය | පුහුණුකරුවන් | 27 |
| 2018.09.27 | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | යොවුන් ඔලිම්පික් ක්‍රීඩා සඳහා සහභාගී වන මළල ක්‍රීඩා,ජල ක්‍රීඩා, දුණු විදීමේ, වෙඩි තැබීමේ හා ජිම්නාස්ටික් ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 07 |
| 2018.09.27 | ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමය | ආසියානු බැඩ්මින්ටන් ශූරතාවලිය සඳහා සහභාගී වන 15 න් පහළ සහ 17 න් පහළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 25 |
| 2018.09.30 | ගම්පහ ශ්‍රී බෝධි ක්‍රීඩාංගනයේ ශ්‍රවණාගාරය | බස්නාහිර පළාත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 12 |
| 2018.10.10 | ජාතික ව්‍යාපාර කළමණාකරන ආයතනය | ජාතික ව්‍යාපාර කළමණාකරන ආයතනයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් | 80 |
| 2018.10.18 | විශේෂ කාර්යය බලකා මූලස්තානයේ | පොලිස් රගර් සංචිතය සඳහා | 49 |
| 2018.10.19 | රගර් යූනියන් | කණිෂ්ඨ රගර් සංචිතය | 16 |
| 2018.10.22 | රගර් යූනියන් | Rugby 7's කණ්ඩායම | 8 |
| 2018.10.29 | ශ්‍රී ලංකා බැඩ්මින්ටන් | කණිෂ්ඨ ලෝක කුසලානය සඳහා සහභාගීවන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා | 12 |
| 2018.10.31 | රත්මලාන ගුවන් හමුදා | ගුවන් හමුදා රගර් කණ්ඩායම | 39 |

| | | | |
|---|---|---|---|
| | මූලස්ථානය | | |
| 2018.11.02 | වැලිසර නාවික හමුදා ශුවණාගාරය | නාවික හමුදා රගර් සංචිතය | 57 |
| 2018.11.07 | හැව්ලොක් | ඩයලොග් ලීග් සඳහා සහභාගීවන හැව්ලොක් රගර් කණ්ඩායම සඳහා | 24 |
| 2018.11.07 | CR &FC | ඉදිරියේදී පැවැත්වීමට නියමිත 2018/2019 ඩයලොග් රග්බි ලීග් සඳහා සහභාගී වන CR &FC කණ්ඩායම සඳහා | 13 |
| 2018.11.28 | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | බයිසිකල් ක්‍රීඩකයින් සඳහා | 35 |
| 2018.11.28 | රගර් යූනියන් | ආසියානු කුසලතාවය සඳහා සහභාගී වන කණිෂ්ඨ රගර් සංචිතය සහා | 40 |
| 2018.12.05 | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | වයඹ විශ්ව විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් | 35 |
| 2018.12.16 | ඩයලොග් මූලස්ථාන ශුවණාගාරයේ දී | Introductory Course for Match Commissioner | 20 |
| 2018.12.18 | ඒකළ ගුවන් හමුදා කඳවුර | බර ඉසිලීමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා | 15 |
| 2018.12.20 | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | 2018 පුහුණුකරුවන්ගේ හා මළල ක්‍රීඩකයන්ගේ අධ්‍යාපනික වැඩසටහන (Hashima City Host Town Project) | |
| 2018.12.31 | ශ්‍රී ලංකා ක්‍රිකට් | 19 න් පහළ ක්‍රිකට් ක්‍රීඩකයින් සහ දෙමව්පියන් සඳහා | 100 |
| **එකතුව** | | **72** | **2268** |

පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා සඳහා සහභාගී වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් විශාල සංඛ්‍යාවකට දැනුවත් කිරීම් සහ උත්තේජක පරීක්ෂණ සිදු කරනු ලැබීය. දැනුවත් කිරීමේ වැඩසටහන් වල කොටසක් ලෙස ජාතික සංචිතයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා වෙන් වූ ආපන ශාලාවේ පෝස්ටරයක් සවි කරනු ලැබීය.

මීට අමතරව දැනුවත් කිරීම වලට අදාළව සිදු කරනු ලැබූ වැඩමුළු පහත සඳහන් පරිදි වේ.

ජපන් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය හා එක්ව පවත්වනු ලබන

"Real Championship" වැඩසටහන.




**<u>WADA Play True ප්‍රශ්ණාවලිය</u>**

| දිනය | කා සඳහාද | සහභාගීත්වය |
|---|---|---|
| 2018.07.19 | බර ඉසිලීම සහ මළල ක්‍රීඩකයින් | 05 |
| 2018.07.27 | වුෂු ක්‍රීඩකයින් | 2 |
| 2018.07.30 | බොක්සිං ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 6 |
| 2018.08.01 | බර ඉසිලීමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 14 |
| 2018.08.03 | කබඩි ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 9 |

## **Out Reach වැඩසටහන්**

| දිනය | ස්ථානය | කා සඳහාද |
|---|---|---|
| 2018.04.20 | දියත ඔරු පැදීමේ ඇකඩමිය- බත්තරමුල්ල | ජාතික ඔරු ශූරතාවලිය සඳහා සහභාගී වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා |
| 2018.04.26 | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය | දකුණු ආසියානු ක්‍රීඩා ශූරතාවලිය සඳහා සහභාගි වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා |
| 2018.06.22 | මහනුවර ගැටඹේ ක්‍රීඩාංගනය | Olympians Run සඳහා සහභාගී වූ පාසල් ශිෂ්‍යයන්, ගුරුවරුන්, ක්‍රීඩකයින් සහ මහජනතාව සඳහා |
| 2018.06.24 | බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව | ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය මඟින් සංවධානය කළ Health Run & Walk සඳහා සහභාගීවූවන් සඳහා |

## **ප්‍රදර්ශණයන්**

| දිනය | විස්තරය |
|---|---|
| 2018.08.25 - 2018.08.26 | බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වූ Sportex 2018 ප්‍රදර්ශණය |
| 2018.08.26 – 2018.08.27 | මොණරාගලදී පැවැත්වූ V 2025 Enterprise Sri Lanka ප්‍රදර්ශණය |
| 2018.09.06 – 2018.09.09 | බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වූ Sri Lanka Sports & Exercise Medicine Conference 2018 |
| 2018.09.25 – 2018.09.28 | කොළඹ රාජකීය විද්‍යාලයේ පැවැත්වූ අධ්‍යාපනික ප්‍රදර්ශණය |

තහනම් උත්තේජක පිළිබඳව දැනුවත් කිරීම වෙනුවෙන් විවිධ ස්ථානයන්හි පැවති ප්‍රදර්ශන සඳහා සහභාගී වීම ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමා හා අධ්‍යක්ෂතුමිය තහනම් උත්තේජක පිළිබඳව ක්‍රීඩකයන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම





## අධ්‍යාපන විෂය මාලාව

මෙම අධ්‍යාපන සැලැස්ම පහත දැක්වෙන

- උත්තේජක භාවිතය පිළබඳ ඉතිහාසය
- උත්තේජක මර්දන නීති රිති
- WADA හා SLADA ආයතනයන් පිළිබඳ විස්තර
- සදාචාරාත්මකව සලකා බැලීම
- තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව
- ඖෂධ පරීක්ෂා කිරීම
- ක්‍රීඩාවේ අතිරේක පෝෂණාධාරක වල භාවිතයන්
- භෞතික චිකිත්සක විනිර්මුක්තිය (TUE)
- සිටිනා ස්ථානය පිළිබඳ තොරතුරු
- පරීක්ෂණ ක්‍රියාවලිය
- මළල ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ජෛව අවසර පත්‍රය
- විමර්ෂණය හා බුද්ධිමය තොරතුරු
- උත්තේජක මර්දන නීති උල්ලංඝනයන්
- උත්තේජක භාවිතයෙන් සෞඛ්‍යයට ඇති විය හැකි බලපෑම්

## ඉගෙනීමේ ක්‍රමවේදයන්

1. දැනුවත් කිරීම
   අ. ප්‍රාථමික මට්ටම
   ආ. මාතෘකා පිළිබඳ දැනුවත් වීම
2. අවබෝධය
   පරිශීලකයා මේ පිළිබඳ දැනුවත් වීම පමණක් නොව ගැටළු වල වැදගත්කම් පිළිබඳ ව අවබෝධ කර ගනී.
3. භාවිතය
   මෙමගින් ලබා ගන්නා දැනුම තීරණ ගැනීමේදී සහ ක්‍රීඩකයෙක්/ක්‍රීඩිකාවක් හෝ ඔවුන්ට සහය වන පුද්ගලයෙක් වශයෙන් තම ජීවිතය තුල ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව ලැබේ.

මාතෘකාවන් යටතේ දැක්වේ.

## වැඩමුළු සඳහා සහභාගී වීම

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නිලදාරීන් පහත සඳහන් වැඩසටහන් සඳහා සහභාගී විය.

- කාර්යාල ක්‍රම හා කාර්යක්ෂමතා වර්ධනය
- මූලික බඳුකරණය
- වැටුප් කළමණාකරනය
- ස්ථාවර වත්කම් කළමණාකරනය
- ලංසු ඇගයීම හා වාර්තාකරණය
- විනය පරීක්ෂණ
- වියයම් හා ගෙවීම් පටිපාටිය
- විස්තරාත්මක ප්‍රසම්පාදන පටිපාටිය
- ගබඩාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- බදුකරණය
- නව බදු නීතිය
- Cyber Security Workshop
- අභ්‍යන්තර විගණනය පිළිබඳ සහතික පත්‍ර මාලාව
- සංයුක්ත සැලැස්ම
- නව විගණන පනත
- රියදුරන්ගේ ආකල්පමය දැනුම වර්ධනය
- කොන්ත්‍රාත් පරිපාලනය

## 2018 වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දින දක්වා භෞතික ප්‍රගතිය

**ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති**

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියෙහි මහල් 05 කින් සමන්විත ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතන ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම.**

තහනම් උත්තේජකයන්ගෙන් තොර පිරිසිදු ක්‍රීඩාවක් ස්ථාපිත කිරීම උදෙසා කැපවී සිටින ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත රුපියල් මිලියන 237 ක වියදමින් මහල් 05 කින් සමන්විත නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා එවක ගරු ක්‍රීඩා අමාත්‍ය නීතිඥ දයාසිරි ජයසේකර මැතිතුමන්ගේ සුරතින් 2016 මාර්තු මාසයේ 31 වන දින මුල්ගල් තබා ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදි.

මෙයට සමගාමීව අභ්‍යන්තර සැළසුම් හා Landscaping කටයුතු ආරම්භ කළ අතර ඒවා ද අවසන් අදියරට පැමිණ ඇත.

මෙම ගොඩනැගිල්ලෙමහි සියළු ඉදිකිරීම් කටයුතු අවසන් අදියරට පැමිණ ඇති අතර 2019 වර්ෂයේ විවෘත කිරීමට අපේක්ෂාවෙන් සිටියි.

| අං. | විස්තරය | ඇස්තමේන්තුගත මුදල(රු. මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) 2018.12.31 | භෞතික ප්‍රගතිය 2018.12.31 |
|---|---|---|---|---|
| 01 | ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල | 211.00 | 172.83 | 99% |
| 02 | අභ්‍යන්තර සැළසුම් සකස් කිරීම (Interior Designing) | 21.50 | 16.30 | 99% |
| | එකතුව | 252.50 | 85.00 | |


## 2018 වර්ෂයේ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ කාර්ය මණ්ඩල වෙනස්වීම්.

2018 වසර තුළදී කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සඳහා කළමණාකරන සහකාර - තාක්ෂණ සේවා ගණයේ තනතුරක් වන තාක්ෂණ සහකාර MA - 2- 1 තනතුර අනුමත කර දෙන ලදී.මෙම තනතුර මඟින් අප නව කාර්යාල පරිශ්‍රයේ යහ පැවැත්ම පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු ඉටුකර ගැනීමට අපේක්ෂිතයි. මේ වන විට එම තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටි සකස් කරමින් පවති. ඒ අනුව 27 ක්ව පැවති අනුමත සේවක සංඛ්‍යාව 2018 වර්ෂය වන විට 28 ක් බවට පත්ව ඇත.

# 2018 ජනවාරි සිට දෙසැම්බර් මස දක්වා පර්යේෂණ ඒකකයේ කාර්ය සාධනය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ පර්යේෂණ ඒකකයේ පළමු පර්යේෂණය ලෙස “ Do Common Arishta Preparations Manufactured in Sri Lanka Contain Anabolic Androgenic Steroids (AAS), Stimulants or Ethanol? “යන මාතෘකාව යටතේ පර්යේෂණයක් සිදු කර එම පර්යේෂණය නිමා කර ප්‍රතිඵල විශ්ලේෂණය හා ලබා ගත් දත්ත අනුව නිගමනයන්ට එළඹීම කරන ලදී. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සතුව පර්යේෂණ සඳහා රසායනාගාරයක් නොමැති බැවින් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සහයෝගීත්වය රසායනික විශ්ලේෂණය සඳහා ලබා ගන්නා ලදී. එම පර්යේෂණයෙහි සොයා ගැනීම් පරීක්ෂණ වාර්තාවක් ලෙස සකස් කරන ලද අතර එය ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ විද්‍යාත්මක සැසි වලදී විද්‍යුත් පෝස්ටරයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

දෙවන පර්යේෂණය “ A Descriptive Study of Pharmaceutical Agents, Supplements and Herbal Products Taken by Athletes in various Sports Categories in Sri Lanka,’’ යන මාතෘකාව යටතේ සිදු කරන ලදී. මේ සඳහා ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන් 390 වකගෙන් දත්ත එක්රැස් කර ගන්නා ලදී. මෙම පර්යේෂණයෙහි සොයා ගැනීම් සමීක්ෂණ වාර්තා 2ක් ලෙස ස්කොට්ලන්තයේ පැවැති “4th International Conference of Sports Medicine And Fitness 2018 “ යන ජාත්‍යන්තර සමුළුවේදී වාචික ඉදිරිපත් කිරීමක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.




ඉදිරියේදී නව පරීක්ෂණ දෙකක් සිදු කිරීමට සැලසුම් කර ඇත. ඒවා නම් “Evaluation of School Level Athlete’s Knowledge about Doping in Sports : A Cross Sectional Study” සහ “ Investigating of the Effect of Sri Lankan Balarishta Consumption on the results of the dope testing” වේ.









4th International Conference on
**Sports Medicine and Fitness**
November 14-15, 2018 | Edinburgh, Scotland

**Dietary supplement usage of athletes in a South Asian regional country; Sri Lanka**

Punchividanelage Nilu Jayashika Fernando[1], Rashani, SAN[1], Pigera, S[1], Niriella, MA[1], Jayawickreme, S[1] and de Silva AP[1,2]
[1]Sri Lanka Anti-Doping Agency, Sri Lanka
[2]University of Kelaniya, Sri Lanka

**Objective:** Identification of dietary habits and dietary supplement usage pattern among Sri Lankan athletes.

**Methods:** Sri Lankan elite athletes (386) above 18 years old, who belong to 14 sports, were randomly selected for survey study. Data was collected through self-administered structured questionnaire.

**Results:** Dietary supplements are being used by 90% of them, mainly including multivitamins (62.5%), protein (47.4%), creatine (19.0%), rehydration fluids (54.5%) being weight gainers (1.1%) the lowest. Players in all 14 sports showed more than 75% dietary supplement usage while badminton, shooting, wrestling, netball and rugby showed significantly higher usage than karate which has the lowest usage. Supplement usage pattern was observed within geographical variation where six provinces showed more than 90% usage compared to all nine. A significant increase in supplement usage was observed in athletes between 21-35 ages. No significant difference was observed in the supplement usage pattern respect to marital status, gender, occupation of the athletes or highest level of participation. All the participants take carbohydrate rich diet for lunch and 13% cereal for breakfast and 4.2% vegetable and meat rich diet for both breakfast and dinner. Among them 10.9% consumes junk food for dinner. From these players 81.9% using fruits, 54.9% using porridge, 43% using soup and 22.8% using drinks made from medicinal plants show similar tendency in using dietary supplements (more than 90%). Among vegetarians (3.6%) the supplement usage is 85.7% which includes 57.1% protein supplements.

**Conclusion:** While dietary supplement usage is high among Sri Lankan athletes irrespective of sport, dietary habits and social status, their dietary practice needs a change.

4th International Conference on
**Sports Medicine and Fitness**
November 14-15, 2018 | Edinburgh, Scotland

**Knowledge, perception and practice of elite athletes towards dietary supplements in a South Asian Country Sri Lanka**

Shehani Anne Dilrushi Pigera[1], S Pigera[1], S A N Rashani[1], P N J Fernando[1], S Jayawickreme[1], M A Niriella and A P de Silva[1,2]
[1]Sri Lanka Anti-Doping Agency, Sri Lanka
[2]University of Kelaniya, Sri Lanka

**Objective:** The main objective is to evaluate knowledge, attitude and belief towards usage of supplements and doping in sports in Sri Lankan athletes.

**Methodology:** A total of 386 elite athletes (33.2% Male and 66.8% Female) from 14 sports categories aged between 18-36 years were randomly selected for a questionnaire based study from January-July 2018.

**Results & Discussion:** Out of 386 athletes 92.7% (P<0.05) believed that the supplements are essential to maintain health and 74.6% believed that it is essential for award winning. Both these perceptions were significantly higher in males than females. Among users 91.3% are aware about prohibited substances in sports showing significance in international players than others. When it comes to practice 76.2% of users are checking the label of supplements for doping substances having significant increase in both international players and those who participated for nutritional workshops. Athletes who participated in nutritional workshops have significantly higher tendency to inform doctor about their sport career while medication. Among supplement users 41.8% are using them to enhance performance in sports and 54% use them to regain energy while 16.5% use without any objective. Among creatine, protein and vitamin consumers respectively, 39%.3, 14.3% and 51.8% are not aware about the supplement type that they consume. Among supplement users, 60.5% (P<0.05) of athletes take supplements by themselves without influence of coach, doctor or any other party.

**Conclusion:** Even though athletes are empowered with the required anti-doping knowledge, their knowledge about supplements and actual practice needs to be improved.

## <u>තොරතුරු තාක්ෂණ අංශයේ ප්‍රගතිය- 2018</u>




### <u>ක්‍රීඩාවේදී හා ඉන් පිටතදී භාවිතා නොකළ යුතු තහනම් ද්‍රව්‍ය හා ක්‍රම ලැයිස්තුව පිලිබඳ පරික්ෂා කිරීම සඳහා ක්‍රීඩකයන්ට හඳුන්වා දුන් මෘදුකාංගය (Android Application)</u>

**Android project**
**DATABASE : Firebase Database with 9000 drug items**
**IDE- Android Studio**

ශ්‍රී ලංකාවේ මිලදී ගන්නා ලද ඖෂධ වල තත්ත්වය, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (WADA) විසින් වාර්ෂිකව නිකුත් කරනු ලබන තහනම් ද්‍රව්‍ය ලැයිස්තුවට (තරඟ අවස්ථාවේදී සහ ඉන් පිටතදී තහනම් කරන ලද ද්‍රව්‍ය හා ක්‍රම අඩංගු ලැයිස්තුව) අනුව පරීක්ෂා කිරීම සඳහා ක්‍රීඩකයන්ට මෙම Android Application මෘදුකාංගය උපකාරී වේ. ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් මෙම ලැයිස්තුවේ එක් එක් ක්‍රීඩා අංශ වලට තහනම් කරන ලද ද්‍රව්‍යන් ද සඳහන් වේ. මෙම Android Application මෘදුකාංගය ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ඖෂධ වල තහනම් තත්ත්ව පිළිබඳ තොරතුරු පරීක්ෂා කිරීම සඳහා වෛද්‍යවරුන්ට, ක්‍රීඩකයින්ට සහ ඔවුන්ගේ සහයකයින්ටද උපකාරී වේ. මෙම Android Application මෘදුකාංගය ශ්‍රී ලාංකික ක්‍රීඩකයින්ට තමන් විසින් භාවිතයට ගනු ලබන ඖෂධ පිළිබඳ නිරන්තරයෙන් නිරීක්ෂණය කිරීමටද උපකාරී වනු ඇත.

## <u>නීති කටයුතු</u>

තහනම් උත්තේජක පිටු දැකීමේ අරමුණින් 2013 අංක 33 දරණ ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට සම්මුති පනත යටතේ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය පිහිටවා ඇත.

තහනම් උත්තේජක පරීක්ෂාව සඳහා ක්‍රීඩකයකුගේ යූරින් සාම්පල් ලබා ගෙන ඒවා A හා B සාම්පල ලෙස වර්ග කර ලෝක තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ පිලිගත් රසායනාගාර පරීක්ෂණයන්ට භාජනය කරනු ලැබේ. මුලින්ම ක්‍රීඩකයාගේ A සාම්පලය රසායනාගාරය මඟින් පරීක්ෂා කරනු ලබන අතර රසායනාගාර වාර්තාවට අනුව යම් ක්‍රීඩකයකු තහනම් උත්තේජක ගත් බවට තහවුරු වුවහොත් එම ක්‍රීඩකයාට B සාම්පල පරීක්ෂාව සඳහා යාමට හැකියාව පවතී. B සාම්පල පරීක්ෂාවේදී ද තහනම් උත්තේජක ලබා ගත් බවට තහවුරු වුවහොත් එහුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලබයි. විනය මූල මණ්ඩලය විසින් කරුණු තහවුරු කර විනය තීන්දුව ලබා දුන් පසුව එය ක්‍රීඩකයාට දන්වනු ලබයි. එම විනය තීන්දුව ක්‍රීඩකයාට ලැබී දින 14ක් තුල ඔහුට අභියාචනා මණ්ඩලයට අභියාචනා කිරීමේ හැකියාව පවතී. අභියාචනා මණ්ඩලය විසින් තීන්දුව ලබා දීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන පාර්ශවයට ස්විට්සර්ලන්තයේ ක්‍රීඩා බේරුම් අධිකරණයට අභියාචනා කිරීමට හැකිය.

2018 වර්ෂයේ ක්‍රීඩකයන් 6 දෙනෙකු තහනම් උත්තේජක ගත් බවට තහවුරු විය.

සවි එසවීම-2
රගර්-2
මළල ක්‍රීඩා-1
පා පැදි ධාවන- 1

මෙම ක්‍රීඩකයන් 6 සඳහා විනය මූල මණ්ඩලය විසින් විනය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

2018 වර්ෂයේදී අභියාචනා 4 ක් විභාග කර ඇත.

## 15th Asia/Oceania Intergovernmental Ministerial Meeting on Anti-Doping in Sports සමුළුව

ආසියානු ශාන්තිකර කලාපීය රටවල් ගණනාවක සහභාගීත්වයෙන් සෑම වසරක් පාසාම පැවැත්වෙන තහනම් උත්තේජක පිළිබඳ ආසියානු ශාන්තිකර කලාපීය අමාත්‍යවරුන්ගේ සමුළුව මෙවර පැවැත්වූයේ ශ්‍රී ලංකාවේදීය. මෙම සමුළුව 2018 ජූනි මස 18 සහ 19 දින වල කොළඹ Kingsbury හෝටලයේදී අති සාර්ථක අන්දමින් පැවති අතර මේ සඳහා ආසියානු ශාන්තිකර කලාපීය රටවල් 28 ක විදෙස් නියෝජිතයන් 78ක් සහභාගී විය.

මෙම සමුළුවේදී තහනම් උත්තේජක භාවිතය කලාපීය වශයෙන් මුලිනුපුටා දැමීම සම්බන්ධයෙන් වැදගත් කරුණු රාශියක් සාකච්ඡාවට ලක්කළ අතර තහනම් උත්තේජක පරීක්ෂණ ක්‍රියාවලියේ නව ප්‍රවණතා සම්බන්ධයෙන් ද යාවත්කාලීන වීමක් සිදුකරනු ලැබීය.

මෙවර 15 වැනි වතාවට සංවිධානය වූ මෙම ආසියානු ශාන්තිකර කලාපීය අමාත්‍යවරුන්ගේ සමුළුව සඳහා ශ්‍රී ලංකාව පළමු වතාවට සත්කාරකත්වය දරණ ලදී. මෙහි දී අපේක්ෂිත අරමුණු සාක්ෂාත් වන පරිදි වඩා සාර්ථක සමුළුවක් ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට හැකියාව උදාකර දීම සම්බන්ධයෙන් නන් අයුරින් සහය වූ විවිධ ආයතනයන් වෙත ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වශයෙන් අප කෘතඥතාවය පළකර සිටින්නෙමු.




මහාචාර්ය අර්ජුන ද සිල්වා (සභාපති)මහතා සභාව අමතමින්




ගරු ක්‍රීඩා අමාත්‍ය ෆයිසර් මුස්තාෆා ආසියානු ශාන්තිකර කලාපීය අමාත්‍යවරුන්ගේ සමුළුව අමතන අවස්ථාව




තහනම් උත්තේජක පිළිබඳ ආසියාතික ශාන්තිකර කලාපීය අමාත්‍යවරුන්ගේ සමුළුව සඳහා සහභාගී වූවන්ගේ සමූහ ඡායාරූපය

## SARADO මාණ්ඩලික සභිකයින්ගේ සමුළුව-2018

දකුණු ආසියාතික කලාපීය තහනම් උත්තේජක පිළිබඳ මාණ්ඩලික සභිකයින්ගේ සමුළුව ද 15 වැනි ආසියා/ශාන්තිකර කලාපීය අමාත්‍යවරුන්ගේ සමුළුවට සමගාමීව 2018 ජූනි මස 20 සහ 21 දින වල කොළඹ Kingsbury හෝටලයේදී සාර්ථක ලෙස පැවැත්වුණු අතර මේ සඳහා දකුණු ආසියාතික කලාපීය රටවල්වල විදෙස් නියෝජිතයන් සහභාගී විය.

සත්කාරක රට වශයෙන් ශ්‍රී ලංකාව ඇතුළුව බංගලාදේශය, නේපාලය, භූතානය සහ මාලදිවයින් යන රටවල විදෙස් නියෝජිතයන් සහභාගී වූ මෙම සමුළුවේදීද වර්තමානයේ කලාපීය රටවල් තහනම් උත්තේජක ක්‍රීඩාවෙන් තුරන් කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති පියවරයන් සහ ඒ හා සම්බන්ධ ඉදිරිපත් කිරීම්ද අදාළ රටවල්වල නියෝජිතයන් විසින් සිදුකරන ලදී.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ සභාපති, මාණ්ඩලික සභිකයින්ගේ සමුළුව ඇමතීම




දකුණු ආසියාතික කලාපීය තහනම් උත්තේජක පිළිබඳ මාණ්ඩලික සභිකයින්ගේ සමුළුව සඳහා සහභාගී වූවන්ගේ සමූහ ඡයාරූපය



## ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය හා ඕස්ට්‍රේලියානු උත්තේජක මර්දන අධිකාරිය (ASADA) සමඟ ඇති කර ගත් අවබෝධතා ගිවිසුම

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය හා ඕස්ට්‍රේලියානු උත්තේජක මර්දන අධිකාරිය 2018 .06.18 දින කොළඹදී අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී.
මෙහිදී ඕස්ට්‍රේලියාව වැනි දියුණු රටකින් තහනම් උත්තේජක පිටු දැකීම සම්බන්ධයෙන් දැනුවත් වීම, ශ්‍රී ලංකාව වැනි තුන්වන ලෝකයේ රටකට ඉතා වැදගත් ආයෝජනයක් වේ. දැනුම හා කුසලතා වර්ධනය, අත්දැකීම හුවමාරු කර ගැනීම සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියානු තහනම් උත්තේජක මර්දන අධිකාරිය විසින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට සහය ලබා දීම මෙහිලා අගය කළ යුතුව ඇත.
ඒ අනුව අදාල අවබෝධතා ගිවිසුම මඟින් ආවරණය වන අංශ ලෙස අධ්‍යාපන හා පරීක්ෂණ විමර්ෂණ, බලාත්මක කිරීම , නීති, පර්යේෂණ , තොරතුරු තාක්ෂණ අංශ හැඳින්විය හැකිය. ඕස්ට්‍රේලියාව වැනි සංවර්ධිත රටකින් මෙලෙස තහනම් උත්තේජක පිටු දැකීම සම්බන්ධයෙන් වත්මන් දැනුම හුවමාරු කර ගැනීම හා යාවත්කාලීන කර ගැනීම ශ්‍රී ලංකාව වැනි රටක් ලද මහඟු භාග්‍යක් කොට සැලකිය හැකිය.




ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අධ්‍යක්ෂ ජනරාල් සමග ඕස්ට්‍රේලියානු උත්තේජක මර්දන අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරී අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම හා එම ගිවිසුම හුවමාරු කර ගැනීම

අවබෝධතා ගිවිසුම සඳහා සම්බන්ධ වූ පිරිසගේ සමූහ ඡායාරූපය

වම් පස සිට :

Mr.David Sharpe – CEO of ASADA
Dr Seevali Jayawickreme- Director General of SLADA
Prof . Arjuna De Silva – Chairman of SLADA
Sir Craig Reedie – President of WADA
(World Anti Doping Agency)
Mr.Olivier Niggli - Director General of WADA
Mr. Robert Koehler - Deputy Director General of WADA



## <u>උත්තේජක මර්දනය පිලිබද විදෙශීය වැඩසටහන් 2018</u>

පරීක්ෂණ, අධ්‍යාපන,පර්යේෂණ,නීති කටයුතු සහ තොරතුරු තාක්ෂණ යනාදී අංශ වල ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නිලදාරීන් සහභාගී වූ විදේශීය සම්මේලන, වැඩමුළු හා සම්මන්ත්‍රණ පහත පරිදි වේ.

- INADO Workshop & WADA ADO Symposium
- WADA ADO Symposium
- 21st Common Wealth Games
- DCO Training Program
- KADA Seminar 2018
- SEARADO Anti- Doping Education Trainers Workshop
- Second WADA Global Education Conference
- Doping Control Officer Conference
- WADA Athlete Biological Passport Symposium
- International Conference on Sports Medicine and Fitness
- International Anti-Doping Seminar in Asia and Oceania 2018

## 2019 වර්ෂයට අදාළ ඉලක්ක හා අරමුණු

- ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සඳහා අංග සම්පූර්ණ විද්‍යාත්මක පර්යේෂණාගාරයක් ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි පරිශ්‍රය තුළ මේ වන විට ඉදිවෙමින් පවතී. එහි සියලු ඉදිකිරීම් කටයුතු මෙම වසර අවසාන වීමට පෙර නිමවීමට නියමිතයි. එම පරීක්ෂණාගාරය තුළ 2019 වසරේදී රසායනාගාර පර්යේෂණ සිදුකිරීමත්, පර්යේෂණ ලිපි සකස් කිරීමත් සිදුකිරීමට බලාපොරොත්තු වේ.
- එම ගොඩනැගිලි පරිශ්‍රයේ ඉදිවීමත් සමඟ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි අනුමත සම්පූර්ණ කාර්ය මණ්ඩලයද සහිතව ජීව ගුණයකින් යුතු පුළුල් මෙහෙවරක් වඩාත් කාර්යක්ෂමව 2019 වසරේදී ද ශ්‍රී ලංකාවෙහි ක්‍රීඩාවට සිදුකිරීමට නියමිතය.
- "සිලෝන් බිස්කට් සමාගම (CBL)" අනුග්‍රාහකදායකත්වය සැපයීමට එම සමාගමෙහි වාර්ෂික ආයතනික සමාජ වගකීම (CSR) යන තේමාව පෙරටු කොට ගෙන ඉදිරිපත් වී ඇත. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය හා සිලෝන් බිස්කට් සමාගම අතර අවබෝධතා ගිවිසුමක් (MoU) අත්සන් කිරීමට කටයුතු යොදා තිබේ. එකී සමාගමෙහි දායකත්වයද ඇතිව තහනම් උත්තේජක පිටු දැකීම හා සම්බන්ධ විවිධ ප්‍රවර්ධන වැඩසටහන් දියත් කිරීමට කටයුතු සැලසුම් කර ඇත.
- 2019 වර්ෂයේදී ද තහනම් උත්තේජන පරීක්ෂණ සහ දැනුවත් කිරීමේ වැඩසටහන් දිවයින පුරා වඩාත් තීව්‍ර ලෙස සිදු කිරීමට බලාපොරොත්තු වේ. ඒ තුළින් ශ්‍රී ලාංකේය ක්‍රීඩාවෙන් තහනම් ද්‍රව්‍ය හා තහනම් ක්‍රම පිටුදැකීම පිළිබඳ දැනුවත්භාවයක් ලබාදීමට අපේක්ෂිතයි. එහිදී ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන්, ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දෙමාපියන් ඇතුළු එයට සබඳතාවයක් දක්වන සියලු පාර්ශව මෙහි ඉලක්ක ගත කණ්ඩායම් වේ. වර්තමාන තරුණ පිරිසද මෙහි ප්‍රධාන ඉලක්කගත කණ්ඩායමකි.
- ශ්‍රී ලංකාවේ පාසල් විෂය මාලාවට තහනම් උත්තේජක පිළිබඳ විෂය කරුණු ඇතුළත් කරමින් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් තුළ ඒ පිළිබඳ දැනුවත්භාවයක් ඇති කිරීමට අවශ්‍ය මූලික අඩිතාලමක් 2017 වසරේදී යෙදුනි. ඒ අනුව 2020 වසරේදී සිදු කිරීමට නියමිත පාසල් විෂය මාලා සංශෝධනයේදී මේ හා සම්බන්ධ කරුණු පාසල් පෙළ පොත් වලට ඇතුලත් කිරීමට කටයුතු සලසා ඇත. මේ සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ සහයෝගය හිමිවිය.
- දිවයින පුරා සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි "උත්තේජක පරීක්ෂණ පාලන නිලධාරීන් (Doping Control Officers)" සහ "ක්‍රීඩකයාගේ පරීක්ෂණ අවස්ථාවේ භාරකරුවන් (Chaperone)" ජාත්‍යන්තර ක්‍රමවේදයන්ට හා ප්‍රමිතීන්ට අනුකූලව දේශීය වශයෙන් පුහුණු කිරීම 2019 දී ආරම්භ කිරීමට නියමිත වේ.
- උත්තේජක පරීක්ෂණ පාලන නිලධාරීන් ලෙස වසර 10 කට වඩා ජාත්‍යන්තර පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකීය උත්තේජක පරීක්ෂණ පාලන නිලධාරීන් සඳහා විදේශීය උත්තේජක මර්දන ආයතනයක සම්පත් දායකත්වය ඇතිව උත්තේජක පරීක්ෂණ පාලන නිලධාරීන් පුහුණු කරවන්නන් ලෙස පුහුණු කිරීමට 2019 වර්ෂයේදී අරමුණු කොට ගෙන පවතී.
- ක්‍රීඩා සංවර්ධන දෙපාර්තුමේන්තුව යටතේ ලියාපදිංචි ක්‍රීඩා සංගම් 63 හි විධායක කාර්ය මණ්ඩල නව පත්වීම් අනුව එම කාර්ය මණ්ඩල දැනුවත් කිරීම.

**ශ්‍රී ලංකා උත්ත්ජක මර්දන නියෝජ්‍ය ආයතනය**
**අංක 100/7,නිදහස් මාවත,කොළඹ 07**
**මූල්‍ය ක්‍රියාකාරකම් ප්‍රකාශය**

| **ශේෂය** | සටහන | **2018 දෙසැම්බර් 31** | **2017 දෙසැබර් 31** |
|---|---|---|---|
| | | *ශ්‍රී ලංකා රුපියල්* | |
| වත්කම් | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත සහ උපකරණ | 1 | 5,412,026.33 | 5,717,666.43 |
| ප්‍රාග්ධන ප්‍රගතිය | 2 | 189,140,409.10 | 104,730,145.10 |
| මුළු ජංගම නොවන වත්කම් | | **194,552,435.43** | **110,447,811.53** |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | **3** | 1,110,839.86 | 633,631.80 |
| අයවිය යුතු දෑ | **4** | - | 1,473,011.66 |
| මුදල් හා මුදල් හා සමාන දෑ | **5** | 1,195,174.60 | 12,796,767.80 |
| මුළු ජංගම වත්කම් | | **2,306,014.46** | **14,903,411.26** |
| **මුළු වත්කම්** | | **196,858,449.89** | **125,351,222.79** |
| අරමුදල් හා වගකීම් | | | |
| **අරමුදල්** | | | |
| රජයේ ප්‍රතිපාදන | **6** | 183,068,042.87 | 109,646,896.47 |
| වෙනත් ප්‍රතිපාදන | 7 | 3,577,310.37 | 4,558,949.00 |
| සමුචිත අරමුදල | 8 | 819,826.91 | 390,403.00 |
| මුළු අරමුදල් | | **187,465,180.15** | **114,596,248.47** |
| **ජංගම වගකීම්** | | | |
| රඳවාගත් මුදල් | 9 | 7,392,700.13 | 5,756,250.38 |
| උපචිත වියදම් | **10** | 527,574.22 | 3,947,719.91 |
| ආපසු ගෙවූ තැම්පතු | | 35,000.00 | 10,000.00 |
| පාරිතෝෂිත වෙන් කිරීම් | 11 | 1,437,995.39 | 1,041,004.03 |
| මුළු ජංගම වත්කම් | | **9,393,269.74** | **10,754,974.32** |
| මුළු අරමුදල් සහ වගකීම් | | **196,858,449.89** | **125,351,222.79** |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලද්දේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ රාජ්‍ය අංශයේ ගිණුම් කරන ප්‍රමිතීන්ට අනුකූලවය.

ඒච්.ඒම්.සී.ජී.දායාරත්න
ගණකාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරිම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරණු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබමි

වෛද්‍ය සීවලී ජයවික්‍රම
අධ්‍යක්ෂ ජනරාල්

මහාචාර්ය අර්ජුන ද සිල්වා
සභාපති

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය**
**අංක 100/7,නිදහස් මාවත,කොළඹ 07**
**මූල්‍ය ක්‍රියාකාරකම් ප්‍රකාශය**

| **දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා** | සටහන | **2018** | **2017** |
|---|---|---|---|
| | | *ශ්‍රී ලංකා රුපියල්* | |
| ආදායම් | | | |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන | 6 | 55,980,853.61 | 31,009,684.53 |
| අමාත්‍යාංශ ප්‍රතිපාදන | 7.4 | 631,714.63 | 625,975.00 |
| වෙනත් ආදායම් | 12 | 2,138,431.72 | 29,800.00 |
| මුළු ආදායම් | | **58,750,999.95** | **31,665,459.53** |
| වියදම් | | | |
| පරිපාලන වියදම් | 13 | (58,321,575.95) | (31,635,659.53) |
| මුළු වියදම් | | **(58,321,575.95)** | **(31,635,659.53)** |
| **ශුද්ධ ලාභය** | | **429,424.00** | **29,800.00** |

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය** **පිටු අංක 03**

**අංක 100/7,නිදහස් මාවත,කොළඹ 07**

**ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය**

| **දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා** | **සමුච්ත ලාභය** | **මුළු අගය** |
|---|---|---|
| | *ශ්‍රී ලංකා රුපියල්* | |
| 2015 ජනවාරි 01 දිනට ශේෂය | 110,540.00 | 110,540.00 |
| වර්ෂයේ ශුද්ධ ලාභය | 94,999.91 | 94,999.91 |
| 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය | **205,539.91** | **205,539.91** |
| වර්ෂයේ ශුද්ධ ලාභය | 155,063.00 | 155,063.00 |
| 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය | **360,602.91** | **360,602.91** |
| වර්ෂයේ ශුද්ධ ලාභය | 29,800.00 | 29,800.00 |
| 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය | **390,402.91** | **390,402.91** |
| වර්ෂයේ ශුද්ධ ලාභය | 429,424.00 | 429,424.00 |
| 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය | **819,826.91** | **819,826.91** |

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය**
**අංක 100/7,නිදහස් මාවත,කොළඹ 07**
**මූල්‍ය ක්‍රියාකාරකම් ප්‍රකාශය**

| දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2018 | 2017 |
|---|---|---|---|
| | | *ශ්‍රී ලංකා රුපියල්* | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් ප්‍රවාහයන්** | | | |
| ශුද්ධ ලාභය | | 429,424.00 | 29,800.00 |
| **ගැලපීම්** | | | |
| ක්ෂය | | 1,828,685.82 | 827,688.47 |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන සඳහා වෙන් කිරීම් | 6 | (55,980,853.61) | (31,009,684.53) |
| යුනෙස්කෝ ප්‍රතිපාදන සඳහා වෙන් කිරීම | 7.1 | (701.00) | - |
| SLADA පාගමන සඳහා වෙන්කිරීම් | 7.2 | (188,168.00) | - |
| RADO අරමුදල සඳහා වෙන් කිරීම් | 7.3 | (161,055.00) | - |
| කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර ඌණතාවය | | **(54,072,667.79)** | **(30,152,196.06)** |
| **කාරක ප්‍රාග්ධන වෙනස් වීම්** | | | |
| (වැඩි කිරීම්)/අඩු කිරීම් තොගය | | (477,207.56) | 13,149.20 |
| (වැඩි කිරීම්)/අඩු කිරීම් රැඳවුම් මුදල් | | - | 5,756,250.00 |
| (වැඩි කිරීම්)/අඩු කිරීම් අයවිය යුතු පරීක්ෂණ ගාස්තු | | 1,473,011.66 | (1,473,011.66) |
| (වැඩි කිරීම්/අඩු කිරීම්) යලි නොගෙවන රැඳවුම් මුදල් | | 25,000.00 | (8,000.00) |
| (වැඩි කිරීම්/අඩු කිරීම්) පාරිතෝෂික වෙන් කිරීම් | 10 | 396,991.36 | 396,493.03 |
| වැඩි කිරීම්/(අඩු කිරීම්) රැඳවුම් මුදල් | | 1,636,449.75 | - |
| වැඩි කිරීම්/(අඩු කිරීම්) උපචිත වියදම් | | (3,420,145.69) | 3,947,719.19 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වන මුදල් (ප්‍රයෝජනයට ගන්නා ලද) | | **(365,900.48)** | **8,632,599.76** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ශුද්ධ මුදල්** | | **(54,438,568.27)** | **(21,519,596.30)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් ප්‍රවාහ** | | | |
| දේපල පිරියත උපකරණ මිලදී ගැනීම් | | (1,477,128.00) | (821,042.90) |
| වාහන මිලදී ගැනීම - WP LW - 0353 | | (45,917.00) | (5,007,800.00) |
| කාරක ප්‍රාග්ධන ප්‍රගතිය | | (84,410,264.00) | (16,855,066.00) |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන පියවීම | | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වන ශුද්ධ මුදල් ප්‍රවාහ (ප්‍රයෝජනයට ගන් | | **(85,933,309.00)** | **(22,683,908.90)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | | |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන | | 129,402,000.00 | 45,200,000.00 |
| ලේකම් - ක්‍රීඩා අමාත්‍යාංශය | | (631,715.94) | 4,835,000.00 |
| SLADA පාගමනෙහි අරමුදල් | | - | - |
| RADO අරමුදල් | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ | | **128,770,284.07** | **50,035,000.00** |
| **වර්ෂය තුළදී මෙහෙයුම් තුළින් ජනිත වූ ශුද්ධ ලාභය ((ප්‍රයෝජනයට ගන්නා ලද)** | | **(11,601,593.20)** | **5,831,494.80** |
| **වර්ෂ ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන දෑ** | | **12,796,767.80** | **6,965,273.00** |
| **වර්ෂ අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ** | | **1,195,174.60** | **12,796,767.80** |

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය**
**මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්**
**2018 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**

**1. වාර්ථා කිරීමේ ආස්ථිතාය**

**1.1 පොදු**

1.1.1 ආයතනයේ අරමුණු

**a)** ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීම පිටුදැකීම සඳහා අවශ්‍ය වන යම් පියවර ගැනීම

**b)** ක්‍රීඩාවලට සම්බන්ධ උත්තේජක ගැනීම සම්බන්ධ ක්ෂේත්‍ර හා අදාළ පර්යේෂණ සහ නියෝජ්‍යායතනය සහ සමාන කර්තව්‍ය ඉටු කරනු ලබන වෙනත් අන්තර්ජාතික සංවිධාන අතර අන්‍යොන්‍ය පරීක්ෂණ ප්‍රවර්ධනය කිරීම

**1.1.2 ප්‍රකාශණ අනුකූලතාවය**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනයේ ගිණුම් සකස් කරනු ලබන්නේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලවය.

**1.1.3. සකස් කිරීමේ පදනම**

මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන්නේ ඓතිහාසික පිරවැය පදනම යටතේය. මෙහිදී උද්ධමනීය සාධක සැලකිල්ලට ගනු නොලබයි.

**1.1.4. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්.**

ශේෂපත්‍ර දිනට පසුව වියහැකි ප්‍රධාන ප්‍රතිවිපාක සඳහා අවශ්‍ය ගැලපීම් මූල්‍ය ප්‍රකාශන වල හා ගිණුම් වල අනාවරණය කරනු ලබයි.

**1.2. වත්කම් සහ අගය කිරීමේ පදනම**

වර්ෂයක් තුළ මුදල් සහ බැංකු ශේෂය සහ මුදල් වලට පරිවර්ථනය කළ හැකි අයිතම සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළ ජංගම වත්කම් ලෙස හඳුනාගෙන ශේෂ පත්‍රයේ විස්තර කර ඇත.

**1.2.1 වත්කම්**

දේපල පිරියත සහ උපකරණ වල අගය දක්වා ඇත්තේ සමුච්ත ක්ෂය අඩු කිරීමෙන් පසුවය.

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය**
**මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්**
**2018 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**

**1.2.2 ක්ෂය**

ක්ෂය ප්‍රතිපත්තිය සිදු කර ඇත්තේ සරළ මාර්ග ක්‍රමයටය. ක්ෂය කරනු ලබන්නේ වත්කම් අත්පත් කරගත් වර්ෂයේ සිට හෝ අදාළ වත්කමේ ඉදිකිරීම් කටයුතු අවසන් වූ වර්ෂයේ සිටය. වත්කමේ අපේක්ෂිත ඵලදායී ජීවකාලය තුළ ආදායම් සහ වියදම් ගිණුමෙන් ක්ෂය කපා හැරීම.

- පරිඝණක සහ උපකරණ 25%
- ගෘහ උපකරණ 10%
- වෙනත් උපකරණ 25%
- මෝටර් වාහන 12.5%

1.3. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හඳුනාගත් සියළුම වගකීම් ගිණුම්ගත කර ඇත.ශේෂපත්‍ර දින සිට වර්ෂයක් තුළ ගෙවිය හැකි හෝ ඉල්ලීමක් මත ගෙවිය හැකි වගකීම් ජංගම වගකීම් ලෙස ශේෂ පත්‍රයේ හඳුනාගෙන ඇත.ගෙවීම සඳහා වර්ෂයකට වැඩි කාලයක් ගත වන වගකීම් ජංගම නොවන වගකීම් වේ.

**1.3.1 සේවකයන්ගේ හිමිකම්.**

සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා දායකත්වය මූල්‍ය ප්‍රකාශනයේ වියදම් ලෙස හඳුනාගෙන ඇත.

**1.3.2. සේවකයන් සඳහා** විශ්‍රාම පාරිතෝෂිත

සෑම සේවකයෙකු සේවයෙහි යෙදී පළමු වර්ෂය අවසන් වූ පසුව විශ්‍රාම පාරිතෝෂික වෙන් කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇත.

1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීමේ පනතට අනුව මෙය සිදු කරනු ලබයි. සෑම වර්ෂයකම දෙසැම්බර් මස අවසාන දිනට ඇති කාර්යය මණ්ඩලයේ දළ වැටුපෙන් භාගයක් පාරිතෝෂිත සඳහා වෙන් කරනු ලබයි.

කෙසේ වෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීමේ පනතට අනුව මෙම ගෙවීම සිදු කරනු ලබන්නේ වසර 5 ක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කරන ලද සේවකයින්ට පමණි.

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය**
**මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්**
**2018 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**

### 1.4. ආදායම් ප්‍රකාශය

**1.4.1 ආදායම්**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලවය අදාළ සේවාව ලබා දීමෙන් පසුව උපචිත පදනම මත ආදායම හඳුනාගනී.

**1.4.2 වියදම්**

වියදම් පිළිබඳ විස්තරයෙහි ලාභය හෝ අලාභය හඳුනාගන්නේ බදු අයකිරීමට පෙර හා හඳුනාගත් සියළු වගකීම් සඳහා වෙන්කිරීමෙන් පසුවය.
වත්කම් නඩත්තු කිරීමේ හා ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ දී දැරීමට වන වියදම් ශුද්ධ ඌනතාවය හෝ අතිරික්තය ගණනය කිරීමේ දී ආදායම් පිළිබඳ විස්තර වල ගලපනු ඇත.
දුරකතන වියදම්, විදුලි වියදම් හා ජල බිල්පත් එම පහසුකම් සඳහා හිමිකම් කියන නිළධාරීන් හා සේවකයවන්ගෙන් අයකරනු ලබයි. එම වියදම් අදාල තීරු හි විස්තර කරනු ලබයි.

**1.4.3 ප්‍රතිපාදන**

ප්‍රතිපාදන හා ආධාර අදාල වියදම් සඳහා ගැලපෙන අයුරින් සකස් කර ඇත. වත්කම් හා සම්බන්ධ මූල්‍ය නොවන ප්‍රතිපාදන, මූල්‍ය වටිනාකම මත ගිණුම්ගත කල යුතු අතර එම වත්කම් ආදායම් ප්‍රකාශයේ වත්කමේ ඵලදායි ජීව කාලය තුල කපා හරිනු ඇත.

### 1.5. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**1.5.1 මුදල්**

අතැති මුදල් හා ඉහළ ද්‍රවශීලතාවක් සහිත කිසිදු අවධානමකින් තොරව පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි වත්කම් මුදල් ලෙස හඳුනා ගනී. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අවශ්‍යතාවය මත අතැති මුදල් හා බැංකු මුදල්, මුදල් ලෙස හඳුනා ගැනේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනුයේ වක්‍ර පදනමටය.

**1.5.2. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්.**

ශේෂපත්‍ර දිනට පසුව වියහැකි ප්‍රධාන ප්‍රතිවිපාක සඳහා අවශ්‍ය ගැලපීම් මූල්‍ය ප්‍රකාශන වල හා ගිණුම් වල අනාවරණය කරනු ලබයි.

**දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**

**සටහන 01**
**දේපල පිරියත සහ උපකරණ**

| පිරිවැය | 2018.01.01 දිනට ශේෂය | ප්‍රවර්ථන වර්ෂයේ එකතු කිරීම් | ප්‍රවර්ථන වර්ෂයේඉවත් කිරීම් | 2018.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | *රුපියල්* | *රුපියල්* | *රුපියල්* | *රුපියල්* |
| ගෘහ භාණ්ඩ | 748,945.00 | - | - | 748,945.00 |
| පරිඝණක සහ උපකරණ | 2,603,567.00 | 171,000.00 | - | 2,774,567.00 |
| වෙනත් උපකරණ | 407,608.90 | 1,126,200.00 | - | 1,533,808.90 |
| රථ වාහන -WPLW - 0353 | 5,007,800.00 | 45,917.00 | | 5,053,717.00 |
| සකස් කරමින් පවතින පේෂණාගාරය | | 179,928.00 | | 179,928.00 |
| | 8,767,920.90 | **1,523,045.00** | **-** | **10,290,965.90** |

| සමුච්ත ක්ෂය | 2018.01.01 දිනට ශේෂය | ප්‍රවර්ථන වර්ෂයේ එකතු කිරීම් | ප්‍රවර්ථන වර්ෂයේඉවත් කිරීම් | 2018.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | *රුපියල්* | *රුපියල්* | *රුපියල්* | *රුපියල්* |
| ගෘහ භාණ්ඩ | 269,147.50 | 74,894.50 | - | 344,042.00 |
| පරිඝණක සහ උපකරණ | 1,919,341.75 | 693,641.75 | - | 2,612,983.50 |
| වෙනත් උපකරණ | 235,790.22 | 383,452.23 | - | 619,242.45 |
| රථ වාහන -WPLW - 0353 | 625,975.00 | 631,714.63 | | 1,257,689.63 |
| සකස් කරමින් පවතින පේෂණාගාරය | | 44,982.00 | | 44,982.00 |
| | 3,050,254.47 | **1,828,685.10** | **-** | **4,878,939.57** |
| | | | | |
| **2018/12/31 දිනට ලේඛණගත අගය** | 5,717,666.43 | **(305,640.10)** | **-** | **5,412,026.33** |

**සටහන 2**

| කාරක ප්‍රාග්ධන ප්‍රගතිය | 2018 | 2017 |
|---|---|---|
| | *රුපියල්* | *රුපියල්* |
| ප්‍රධානොඩනැගිල්ල ඉදිකිරීම | 172,833,229.10 | 98,775,335.10 |
| ප්‍රධානොඩනැගිේ අභ්‍යන්තර සැලසුම් සහ ගෘහ භාණ්ඩ | 16,307,180.00 | 5,954,810.00 |
| | **189,140,409.10** | **104,730,145.10** |

කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම යටතට ගෙන ඇති ගොඩනැගිලි ඉදිකිරීම් වියදම මගින් ප්‍රාග්ධන වියදමෙහි ප්‍රගතිය නිරූපනය කරනු ලබයි. කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු 2018/12/31 වන විටත් නිම නොතිබුණි.ප්‍රාග්ධන

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය**
**අංක 100/7,නිදහස් මාවත,කොළඹ 07**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
**දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**

| සටහන 13 | **2018** | **2017** |
|---|---|---|
| **6.පරිපාලන වියදම්** | *ශ්‍රී ලංකා රුපියල්* | |
| වැටුප් හා වේතන | 9,678,345.68 | 8,757,824.62 |
| අතිකාල දීමනා සහ නිවාඩු දීමනා | 557,395.24 | 332,336.64 |
| සේවක අර්තසාධක අරමුදල | 1,951,390.36 | 1,630,261.83 |
| සේවා නියුක්තිකයේ භාරකාර අරමුදල | 292,708.56 | 244,221.94 |
| ගෘහස්ථ, ප්‍රවාහන සහ ඉන්ධන දීමනා | 600,000.00 | 119,340.00 |
| විදේශීය ගමන් වියදම් | 6,180,014.59 | 3,321,894.82 |
| ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල උපකරණ | 433,576.24 | 334,977.06 |
| ඉන්ධන | 912,117.00 | 382,692.50 |
| සාම්පල් කට්ටල | - | 541,240.27 |
| වාහන නඩත්තු වියදම් | 298,316.20 | 239,358.94 |
| ගොඩනැගිලි සහ සැලසුම් නඩත්තු වියදම් | 3,150.00 | - |
| යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම් | 558,724.15 | 229,704.45 |
| ප්‍රවාහන | 1,089,133.33 | 2,653,245.00 |
| මෙහෙයුම් කල්බදු සඳහා ගෙවීම් | 2,760,000.00 | - |
| තැපල් සහ සන්නිවේදන | 581,784.06 | 575,622.27 |
| විදුලිය සහ ජලය | 90,265.45 | 63,300.40 |
| තහනම් උත්තේජක පරීක්ෂණ ගාස්තු 13.1 | 13,220,336.25 | 4,234,704.83 |
| ප්‍රචාරණය සහ ප්‍රවර්ධනය | 1,110,254.34 | 669,580.00 |
| පුහුණු සහ රැස්වීම් වියදම් | 883,078.26 | 728,749.68 |
| WADA,iNADO සාමාජිකත්වය අළුත් කර ගැනීමේ වියදම් | 3,032,379.88 | 1,185,436.52 |
| වෙනත් | - | 37,166.00 |
| විකුණුම් සහ පරීක්ෂණ වියදම් | 8,750.00 | 61,686.00 |
| දැනුවත් කිරීමේ වැඩමුළු | 145,086.50 | - |
| ධාරිතාව වර්ධන | 1,296,096.06 | 3,325,534.26 |
| උපයන විට ගෙවීම් | 122,350.00 | 116,625.00 |
| ක්ෂය වීම් | 1,828,685.10 | 1,453,663.47 |
| පාරිතෝෂිත වෙන් කිරීම් | 396,991.36 | 396,493.03 |
| පේෂණ වියදම් | 158,002.50 | |
| 15 වන ආසියානු සමුද්‍රකලාපීය රැස්වීම | 10,132,644.84 | |
| | **58,321,575.95** | **31,635,659.53** |

| සටහන 13.1 | | |
|---|---|---|
| තහනම් ලේජක වියදම් | | |
| වර්ෂය සඳහා වියදම | 13,220,336.25 | 6,210,231.49 |
| ආදායම් ලැබීම් | | (1,975,526.66) |
| | **13,220,336.25** | **4,234,704.83** |

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය**

**අංක 100/7,නිදහස් මාවත,කොළඹ 07**

2018 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා අයවැය හා සත්‍ය වියදම් ප්‍රකාශය

| විස්තරය | අයවැය 2018 | සංශෝධිත අයවැය 2018 | 2018.12.31 දක්වා | සත්‍ය [illegible] | % |
|---|---|---|---|---|---|
| | රුපියල් | රුපියල් | රුපියල් | රුපියල් | |
| පෞද්ගලික පඩිනඩි | **17,050,000.00** | **14,585,000.00** | **12,474,562.06** | **2,110,437.94** | **86%** |
| වැටුප් හා වේතන | 14,582,000.00 | 11,167,000.00 | 9,679,394.24 | 1,487,605.76 | 87% |
| අතිකාල හා නිවාඩු දින ගෙවීම් | 400,000.00 | 650,000.00 | 554,827.88 | 95,172.12 | 85% |
| සේවක අර්ථසාධක අරමුදල | 1,654,400.00 | 2,354,400.00 | 1,948,121.68 | 406,278.32 | 83% |
| සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල | 413,600.00 | 413,600.00 | 292,218.26 | 121,381.74 | 71% |
| ගමනා ගමන වියදම් | **5,200,000.00** | **7,600,000.00** | **6,780,014.59** | **819,985.41** | **89%** |
| දේශීය ගමන් වියදම් | 1,200,000.00 | 800,000.00 | 600,000.00 | 200,000.00 | 75% |
| විදේශීය ගමන් වියදම් | 4,000,000.00 | 6,800,000.00 | 6,180,014.59 | 619,985.41 | 91% |
| සැපයුම් | **1,500,000.00** | **1,500,000.00** | **1,347,850.74** | **152,149.26** | **90%** |
| Jjj | 500,000.00 | 500,000.00 | 437,083.74 | 62,916.26 | 87% |
| ඉන්ධන | 1,000,000.00 | 1,000,000.00 | 910,767.00 | 89,233.00 | 91% |
| නඩත්තු විදම් | **650,000.00** | **1,050,000.00** | **856,682.85** | **193,317.15** | **82%** |
| වාහන | 300,000.00 | 400,000.00 | 298,316.20 | 101,683.80 | 75% |
| යන්ත්‍රෝපකරණ සහ යන්ත්‍රසූත්‍ර | 300,000.00 | 600,000.00 | 555,216.65 | 44,783.35 | 93% |
| ගොඩනැගිලි හා සංයුතිය | 50,000.00 | 50,000.00 | 3,150.00 | 46,850.00 | 6% |
| සේවා | **11,600,000.00** | **11,265,000.00** | **10,198,773.97** | **1,066,226.03** | **91%** |
| ප්‍රවාහන | 1,320,000.00 | 1,320,000.00 | 1,177,133.33 | 142,866.67 | 89% |
| මෙහෙයුම් කල්බදු සඳහා කුලී | 2,760,000.00 | 2,990,000.00 | 2,760,000.00 | 230,000.00 | 92% |
| තැපල් හා සන්නිවේදන | 960,000.00 | 800,000.00 | 661,819.43 | 138,180.57 | 83% |
| විදුලිය හා ජලය | 720,000.00 | 120,000.00 | 90,434.93 | 29,565.07 | 75% |
| ගොඩනැගිලි කුලී, දේශීය බදු හා උපයන විට ගෙවීම් | 240,000.00 | 150,000.00 | 122,350.00 | 27,650.00 | 82% |
| වාර්ෂික අළුත්වැඩියා කිරීම් | 1,500,000.00 | 3,300,000.00 | 3,239,927.24 | 60,072.76 | 98% |
| අලෙවි හා පර්යේක්ෂණ | 200,000.00 | - | 8,750.00 | (8,750.00) | |
| දැනුවත් කිරීමේ වැඩමුළු | 600,000.00 | 175,000.00 | 145,086.50 | 29,913.50 | 83% |
| බලාත්මක කිරීමේ වියදම් | 100,000.00 | - | - | - | |
| ප්‍රචාරනය හා ප්‍රවර්ධනය | 700,000.00 | 1,200,000.00 | 1,110,194.28 | 89,805.72 | 93% |
| අධ්‍යක්ෂ මණ්ඩල හා වෙනත් දීමනා | 500,000.00 | 1,050,000.00 | 883,078.26 | 166,921.74 | 84% |
| සනීපාරක්ෂක සේවා හා ආරක්ෂණ | 1,800,000.00 | 140,000.00 | - | 140,000.00 | 0% |
| වෙනත් | 200,000.00 | 20,000.00 | - | 20,000.00 | 0% |
| **අයභාර වියදම්** | **36,000,000.00** | **36,000,000.00** | **31,657,884.21** | **4,342,115.79** | **88%** |
| **ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම** | **125,890,000.00** | **133,990,000.00** | **86,075,062.20** | **47,914,937.80** | **64%** |
| ගොඩනැගිලි හා සංයුතිය | 18,000,000.00 | 107,100,000.00 | 73,617,360.31 | 33,482,639.69 | 69% |
| ගොඩනැගිලි අභ්‍යන්තර සැලසුම්, ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 9,000,000.00 | 18,300,000.00 | 11,965,904.39 | 6,334,095.61 | 65% |
| යන්ත්‍රෝපකරණ, යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 500,000.00 | 200,000.00 | 154,867.00 | 45,133.00 | 77% |
| සකස් කරමින් පවතින පර්යේක්ෂණ අංශය | 95,000,000.00 | 8,000,000.00 | 179,928.00 | 7,820,072.00 | 2% |
| පර්යේක්ෂණ ප්‍රතිපාදන | 3,390,000.00 | 390,000.00 | 157,002.50 | 232,997.50 | 40% |
| | | | | | |
| ධාරිතාවය වර්ධනය | **4,000,000.00** | **4,000,000.00** | **1,363,218.44** | **2,636,781.56** | **34%** |
| | | | | | |
| තහනම් උත්තේජක පරීක්ෂණ | **25,000,000.00** | **25,000,000.00** | **15,753,726.97** | **9,246,273.03** | 63% |

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය**

**අංක 100/7,නිදහස් මාවත,කොළඹ 07**

2018 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා අයවැය හා සත්‍ය වියදම් ප්‍රකාශය

| විස්තරය | අයවැය 2018 | සංශෝධිත අයවැය 2018 | 2018.12.31 දක්වා සත්‍ය වියදම | වෙනස | % |
|---|---|---|---|---|---|
| | *රුපියල්* | *රුපියල්* | *රුපියල්* | *රුපියල්* | |
| ආසියානු ශාන්තිකර අන්තර් රාජ්‍ය අමාත්‍යවරුන්ගේ සමුළුව | **19,110,000.00** | **12,110,000.00** | **10,073,834.84** | **2,036,165.16** | **83%** |
| | | | | | |
| **ප්‍රාග්ධන වත්කම් පුනුරුත්තාපනය හා සංවර්ධනය** | **1,100,000.00** | **-** | **-** | **-** | |
| ගොඩනැගිලි හා සංයුතිය | 100,000.00 | - | - | - | |
| යන්ත්‍රෝපකරණ, යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 200,000.00 | - | - | - | |
| වාහන | 800,000.00 | - | - | - | |
| | | | | - | |
| **මුළු ප්‍රාග්ධනය** | **175,100,000.00** | **175,100,000.00** | **113,265,842.45** | **61,834,157.55** | **65%** |
| | | | | | |
| ***මුළු එකතුව*** | **211,100,000.00** | **211,100,000.00** | **144,923,726.66** | **66,176,273.34** | **69%** |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | සීඑස්/ඒ/එස්එල්ඒඩීඒ/06/18/06 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2019 මැයි 23 දින |

සභාපති,
ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය.

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලින් බැහැරවීම්

(i) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09 හි 47 (අ) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,110,839 ක් වූ තොග, අගය කිරීම සම්බන්ධ භාවිතා කළ පිරිවැය සූත්‍රයද ඇතුළුව තොග මැනීමේදී යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි.

(ii) වර්ෂ 3 කට අධික කාලයක සිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රදාන ලෙස දක්වා තිබුණු රු.349,924 ක් සමාලෝචිත වර්ෂයේදී ආදායමට ගෙන තිබුණු අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 132 වගන්තිය ප්‍රකාරව එම තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

(iii) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 86 (ආ) වගන්තිය ප්‍රකාරව වත්කම් සඳහා භාවිත කරන ක්ෂය ක්‍රමය හෙළිදරව් කළ යුතු වුවද නියෝජ්‍යායතනය විසින් සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.179,928 ක් වූ පර්යේෂණ උපකරණ වලින් සමාලෝචිත වර්ෂයේදී රු.44,982 ක් ක්ෂය කර තිබුණු අතර එම ක්ෂය කිරීමේ පදනම හෙළිදරව් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය නියෝජ්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, නියෝජ්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස නියෝජ්‍යායතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා නියෝජ්‍යායතනය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නියෝජ්‍යායතනය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ නියෝජ්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති රෙගුලාසි, විධි විධාන වලට යොමුව | | විස්තරය |
|---|---|---|
| (i) | 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ලබා ගැනීමට එරෙහි සම්මුති පනතේ 33 වන වගන්තිය | උත්තේජක ද්‍රව්‍ය ලබා ගැනීමට එරෙහිව රීති සම්පාදනය කර අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ ගැසට් පත්‍රයේ පල කර බලාත්මක කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට නියෝජ්‍යායතනය පිහිටුවා වර්ෂ 5 ක් ගත වී තිබුණද ආයතනයෙන් අපේක්ෂා කරන ලද ප්‍රධානතම කාර්යය වූ උත්තේජක ලබා ගැනීමට එරෙහිව ක්‍රියාකිරීම සඳහා රීති සකස් කර නොතිබුණි. |
| (ii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා භාණ්ඩාගාර ලේකම්ගේ 2001 ජනවාරි 25 දිනැති අංක IAI/2001/1 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 ඡේදය | අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා අභ්‍යන්තර විගණනයන් සිදු කිරීමට කටයුතු කර නොතිබුණු අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් හෝ අභ්‍යන්තර විගණනයක් සිදු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 772 | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මගින් හඳුනා ගෙන තිබුණු ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ සුදුස්සක් කොට බැහැර කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. |

- **අයවැය ලේඛනමය පාලනය**

අයවැය ගත වියදම් තත්‍ය වියදම් සමග සැසදීමේදී විෂයයන් 17 කට අදාළව සියයට 10 සිට සියයට 97 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලක කාරකයන් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

- **කාර්ය මණ්ඩල පරිපාලනය**

2015 වර්ෂයේ සිට පුරප්පාඩු වී පැවති අධ්‍යක්ෂ තනතුරු 01 ක්, සහකාර අධ්‍යක්ෂ තනතුරු 02 ක් හා රියදුරු තනතුරු 01 ක් පිරවීම සඳහා නියෝජ්‍යායතනය විසින් සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි.

- **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | නිමකළ දිනය | 2018 දෙසැම්බර් 31 දිනට වියදම |
|---|---|---|---|---|---|
| | රු.මිලියන | | | | රු.මිලියන |
| නව ගොඩනැගිලි ඉදිකිරීම | 204.33 | 2016.04.28 | 2018.07.10 | 2018.11.24 | 172.8 |
| ගොඩනැගිල්ලේ අභ්‍යන්තර සැලසුම් හා ලී බඩු උපකරණ | 26.5 | 2016.12.31 | 2018.09.30 | 2018.12.10 | 16.3 |

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මූලික ඇස්තමේන්තුව සකස් කිරීමේදී හඳුනා ගත හැකිව තිබුණු ගොඩනැගිල්ලේ සිවිලිම ඉදිකිරීම, විදුලි ජනක යන්ත්‍ර හා වායු සමීකරණ පද්ධතියන් සැපයීම හා සවි කිරීම, විදුලිය ලබා ගැනීමේ කටයුතු, ගොඩනැගිල්ලේ කාමර වෙන් කිරීමේ කටයුතු හා ජල සැපයුම් කටයුතු මූලික ඇස්තමේන්තුවට ඇතුළත් නොකිරීම හේතුවෙන් ගොඩනැගිල්ල සඳහා අත්‍යවශ්‍ය වූ විෂයයන් 19 ක් සඳහා අමතර ඇස්තමේන්තුවක් සකසා එම කටයුතු මුල් කොන්ත්‍රාත්කරු වෙත පවරා තිබුණි. ඒ අනුව මුල් කොන්ත්‍රාත්තුව පිරිනැමීමේදී සියලුම විෂයයන් ඇතුළත් කර ලංසු කැඳවා නොතිබීම හේතුවෙන් වඩාත් වාසිදායක තරඟකාරී මිලකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ අවස්ථාව මගහැරී තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) විදුලිබල සම්බන්ධතාවය ලබා ගැනීමට ප්‍රමාද වීම සහ මළ හා අපජල සම්බන්ධතාව ලබා ගැනීමට ප්‍රමාද වීම මෙම ව්‍යාපෘතිය නිසි වේලාවට නිම නොකිරීමට හේතුවී තිබුණි.

- **කළමනාකරණ ක්‍රියාකාරකම්**

**(අ) තහනම් උත්තේජක පරීක්ෂාව**

පහත කරුණු නිරීක්ෂණය විය.

**(i) මානව තහනම් උත්තේජක පරීක්ෂාව**

සමාලෝචිත වර්ෂයේදී නියෝජ්‍යායතනය විසින් මානව තහනම් උත්තේජක සම්බන්ධ පරීක්ෂා කිරීම් 276 ක් සිදුකර තිබුණු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පරීක්ෂා කිරීම් 134 ක් සිදුකර තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පරීක්ෂා කිරීම් 142 කින් වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී තහනම් උත්තේජක ගැනීම් 06 ක් සනාථ වී තිබුණු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේදී උත්තේජක ගැනීම් 05 ක් සනාථ වී තිබුණි. තවද ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලියාපදිංචි ජාතික ක්‍රීඩා 62 ක් පැවති අතර, සමාලෝචිත වර්ෂයේදී ජාතික ක්‍රීඩා 17 කට අදාළව හා 2017 වර්ෂයේදී ජාතික ක්‍රීඩා 09 කට අදාළව පමණක් මෙම පරීක්ෂා කිරීම් සිදු කර තිබුණි.

**(ii) සත්ත්ව තහනම් උත්තේජක පරීක්ෂාව**

සමාලෝචිත වර්ෂයේදී සත්ත්ව උත්තේජක පරීක්ෂා කිරීම් ගණන 09 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේදී උත්තේජක පරීක්ෂණ ගණන 07 ක් වී තිබූ අතර වර්ෂ දෙකේදීම සත්වයින්ට උත්තේජක දීම් කිසිවක් සනාථ වී නොතිබුණි.

**(ආ) සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම**

පාසැල් ශිෂ්‍යයන්, ක්‍රීඩා නිලධාරීන්, භෞතික චිකිත්සක පුහුණුකරුවන්, ක්‍රීඩා පුහුණුකරුවන්, ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ දෙමව්පියන් ක්‍රීඩා සම්භාහකයින් යන පිරිස් සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ යුතුකම් හා වගකීම්, තහනම් උත්තේජක භාවිතයේ අහිතකර ප්‍රතිවිපාක, මත්ද්‍රව්‍ය පාලනය කිරීමේ ක්‍රියාවලිය, අවශ්‍ය තොරතුරු ලබා ගන්නා ක්‍රමවේද, තහනම් උත්තේජක භාවිතය වළක්වා ගැනීමේ චිකිත්සක ක්‍රමවේදය, ලෝක මත්ද්‍රව්‍ය විරෝධතා වැඩසටහන පිළිබඳ මූලික අවබෝධය යන කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සම්මන්ත්‍රන හා දැනුවත් කිරීමේ වැඩසටහන් 72 ක් සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබුණු අතර ඊට සහභාගිවූ පිරිස 2,268 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වැඩසටහන් 51 ක් සඳහා සහභාගිවූ පිරිස 3,581 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වැඩසටහන් පැවැත්වීමේ ප්‍රමාණය 21 කින් වැඩි වී තිබුණද ඒ සඳහා සහභාගිවූවන්ගේ සංඛ්‍යාව 1,313 කින් අඩු වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති